# ප්‍රගතිය
# 1992

REF

පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

# ප්‍රගතිය
# 1992

පාරිසරික සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

යුනිටි ප්ලාසා ගොවතැඟිල්ල. කොළඹ 4.

# පටුන

## පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය


| | |
|---|---|
| පරිසර කටයුතු | 1 |
| ප්‍රවෘත්ති හා ප්‍රචාරක අංශය | 10 |
| පාර්ලිමේන්තු කටයුතු | 14 |


## මධ්‍යම පරිසර අධිකාරිය


| | |
|---|---|
| පරිසර සංරක්ෂණ අංශය | 16 |
| ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය | 22 |
| ප්‍රවර්ධන අංශය | 34 |

# හැඳින්වීම.

පරිසරය ආරක්ෂා කිරීමෙහි හා කළමනාකරණය කිරීමෙහි අවශ්‍යතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිලිගෙන තිබේ. මෙම කාර්යය සඳහා අර්ථාන්විත හා ක්‍රමානුකූල පියවර රාශියක් සමාලෝචිත වර්ෂය තුල ගෙන තිබීම සුවිශේෂයෙන් සඳහන් කලයුතු කරුණකි. ශ්‍රීමත් ජනාධිපතිතුමන් විසින් පරිසර විෂය සඳහා කැබිනට් අමාත්‍යාංශයක් 1990 වසරේදී පිහිටුවනු ලැබූ අතර, එම අමාත්‍යාංශයේ ක්‍රියාකාරී ශක්තිය වර්ධනය කිරීම පිණිස පරිසරය පිළිබඳ විෂය නිශ්චිත අමාත්‍යවරයෙකු සහ පාර්ලිමේන්තු කටයුතු රාජ්‍ය අමාත්‍යවරයෙකු ද පත් කරන ලදි.

ජාතික පාරිසරික වාර්තාව සහ ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම 1991 දී පළ කැරිණි. 1992 දී ක්‍රියාකාරීත්වයට යොමු වූ ප්‍රධාන කරුණ වූයේ රියෝ ද ජෙනයිරෝහිදී පැවැත්වුනු එක්සත් ජාතීන්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ සමුළුවයි.

මෙතෙක් ලෝකයේ රාජ්‍ය නායකයින් වැඩිම සංඛ්‍යාවක් සහභාගි වූ මෙම ඓතිහාසික සමුළුවට සහභාගි වී කලාපීය හා දේශීය පාරිසරික ප්‍රශ්න ගැන අදහස් දැක්වීමට ශ්‍රී ලංකාවට ලැබුණු අවස්ථාව විශේෂ කොට සැලකිය යුතුය.

ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම මෙහෙයවමින් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සමුළුවේදී දැක්වූ අදහස් සහ පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය, ගරු එම්. වින්සන්ට් පෙරේරා මහතා කළ දේශනය ද, කලාපීය හා දේශීය පාරිසරික කරුණු කෙරෙහි අවධානය යොමු කරන සුළු ආකර්ෂණීය තත්ත්වයක් ගැනුනි.

ශ්‍රී ලංකාව පරිසරය පිළිබඳ අන්තර් ජාතික ගිවිසුම් ගණනාවක කොටස් කාරයෙකි. මෙම ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය ක්‍රියාකාරීව කටයුතු කර තිබේ. මීට අදාළ යෝග්‍ය ක්‍රියාමාර්ග වර්ධනය කිරීම ජාතික සහ අන්තර් ජාතික වශයෙන් ඉටුකර ඇත.

ගරු එම්. වින්සන්ට් පෙරේරා ඇමතිතුමා 1992 ජුනි 10 වන දා එහිදී ජීව විවිධත්ව ප්‍රඥප්තියට සහ දේශගුණික විපර්යාස සම්බන්ධ ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව වෙනුවෙන් අත්සන් තැබීය. මෙය කරන ලද්දේ දකුණු ආසියාතික සහයෝගිතා කලාපීය සංවිධානයට අයත් රටවල උපදෙස් පිට ය. ඒ රටවල් සියල්ලම එයට අත්සන් තැබීය.

1992 පරිසර කටයුතු පිළිබඳ උච්ච අවස්ථාව දකුණු ආසියානු පාරිසරික වැඩ සටහනේ පාලක මණ්ඩල රැස්වීම ශ්‍රීමත් ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් විවෘත කිරීමයි. ගරු එම්. වින්සන්ට් පෙරේරා ඇමතිතුමා සභාපතිත්වය දැරූ මෙම රැස්වීමේදී උසස් පරමාර්ථ ඇති කලාපීය පාරිසරික වැඩ සටහන් සම්මත විය. මෙහිදී ශ්‍රී ලංකා නියෝජිත පිරිස මෙහෙයවූයේ ගරු පාරිසරික අමාත්‍ය හා ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය විමල් වික්‍රමසිංහ ඇමතිතුමාය.

අමාත්‍යාංශය යටතේ පවත්නා සංස්ථාපිත ආයතනයක් වන මධ්‍යම පරිසර අධිකාරිය හා සම්බන්ධ වී පාරිසරික දැනුවත් කිරීම වර්ධනය, සංවර්ධනයේ දී පාරිසරික ප්‍රතිපත්ති සැලසුම් කිරීම, විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ උපදෙස්දීම, පාරිසරික කටයුතු හා සම්බන්ධ ප්‍රධාන පෙළේ විදේශ ආධාර වැඩ සටහන් මෙහෙයවීම ඉටු කැරේ. ප්‍රතිපත්ති සංවර්ධනයට පාරිසරික නීති සහ රෙගුලාසි සම්පාදනය සහ පාරිසරික ආකල්පයකින් සංවර්ධන යෝජනා සමීක්ෂණය මෙහිලා විශේෂ වේ. මින් වැඩි කොටසක් ජාතික පාරිසරික උපායමාර්ග කමිටු වැඩ සටහනට අයත් ය. පරිසරයට සිදුවන බලපෑම් තක්සේරුව සහ පාරිසරික බලපත්‍ර නිකුත් කිරීම ආදියට අදාළ කටයුතු-වල මධ්‍යම පරිසර අධිකාරිය නිරත වෙයි.

මෙම වාර්තාව පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ 1992 ජනවාරියේ සිට නොවැම්බර් මාසය දක්වා කටයුතු පිළිබඳ තොරතුරු සපයයි.

---

# පාරිසරික හා
# පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

# පරිසර කටයුතු

## ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම ( NEAP )

ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකාවේ ප්‍රථම සර්වග්‍රාහී පරිසර සැලසුම් ලේඛනයයි. එය පරිසර ප්‍රශ්න සහ ගැටළු, ප්‍රමුඛත්ව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ අංශ 12 යටතේ විග්‍රහයදම් ඇස්තමේන්තු හඳුනා ගෙන තිබේ. මෙම කටයුතුවලට පෘථිවිය, ජලය, ඛනිජ සහ වෙරළබඩ සම්පත්, වන විද්‍යාව, ජීව විවිධත්වය සහ වන ජීවීන්, නාගරික සහ කාර්මික දූෂණය, බලශක්තිය, පරිසර අධ්‍යාපනය, සංස්කෘතිය සහ ආයතනික ග්‍රහණ සාමර්ථ්‍ය අඩංගු වේ.

ලෝක බැංකුව, එක්සත් ජනපද ආධාර, නොරාඩ්, නෙදර්ලන්ත රජය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය, ස්වභාව ධර්මය සංරක්ෂණය කිරීම පිළිබඳ ජාත්‍යන්තර සංගමය ( IUCN ) වැනි ආයතනවලින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවලට සැපයෙන මුදල් ආධාරවලට අමතරව, මෙතෙක් ක්‍රියාත්මක නොවූ ඉතිරි වැඩ සටහන් සඳහා ආධාර ලබා ගැනීමට නව ආධාරකරුවන් සෙවීමේ කාර්යයෙහි දැනට නියුක්ත වේ. ඇතැම් ව්‍යාපෘති සඳහා ලෝක බැංකුව සහ ස්වභාව ධර්මය සංරක්ෂණය කිරීම පිළිබඳ ජාත්‍යන්තර සංගමය ඇතුළු ආධාරක ආයතන ගණනාවකින්ම දැනටමත් ස්ථිර ප්‍රතිචාර ලැබී ඇත.

## දකුණු ආසියාතික සහයෝගිතා පරිසර වැඩ සටහන

1981 කොළඹ දී පිහිටුවන ලද දකුණු ආසියාතික සමුපකාර වැඩ සටහනට ඇෆ්ගනිස්ථානය, බංගලා දේශය, භූටානය, ඉන්දියාව, ඉරානය, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව ඇතුළත් ය. කලාපයේ පාරිසරික කටයුතු පිළිබඳ කලාපීය සහයෝගය ඉන් බලාපොරොත්තු වේ. එය කලාපීය පාරිසරික වැඩ සටහන් කීපයක් ඉටුකර තිබේ. ආසියානු සංවර්ධන බැංකුවේ උදව්ව ඇතිව පිහිටුවා තිබෙන 'කලාපීය පරිසර ස්වභාවික සම්පත් පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානය' ( RENRIC ) සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන විට, පාරිසරික කරුණු පිළිබඳ තොරතුරු බෙදාහරින මධ්‍යස්ථානයක් වනු ඇත. මෙවැනි තවත් ආයතනයක් නම් දකුණු ආසියාතික මුහුදු සඳහා පවත්වන කලාපීය මුහුදු පිළිබඳ වැඩ සටහනයි.

## පරිසරය සහ සංවර්ධනය පිළිබඳ මිහිතල මස්තක සමුළුව සැමරීමේ ජාතික වැඩ සටහන

පාරිසරික පිරිහීම නතර කිරීමට උපායමාර්ග සටහන් කළ මස්තක මිහිතල සමුළුව හෙවත් පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව ( UNCED ) පසුගියදා බ්‍රසීලයේ රියෝ ද ජැනෙයිරෝහිදී පැවැත්විණි. ඒ අතරම

සංවර්ධනය වෙමින් පවතින රටවල් තමන්ගේ පරිසරය සුරැකීමට සහ පවත්වා ගෙන යෑමට වැඩ සටහන් යෙදවීම අවශ්‍යය.

1992 ජුනි 01 සිට 14 වනදා තෙක් පැවැති මිහිතල සමුළුව සිහි කිරීමට වැඩ සටහන් දියත් කිරීමට මෙම අමාත්‍යාංශය ක්‍රියා ආරම්භ කළේය. එය ''පාරිසරික දෙසතිය'' ලෙස සලකා මුළු අවුරුද්දටම වැඩ සටහන් දීර්ඝ කෙරිණ.

මෙම වැඩ සටහනට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණා පමණක් නොව රජයේ අනෙක් ආයතනවලින් ද ඉතා උසස් ප්‍රතිචාරයක් ලැබිණ. මෙකී ආයතන පැළ සිටුවීමේ ව්‍යාපාර, චිත්‍ර, කවි, නාට්‍ය, ප්‍රබන්ධ හා පෝස්ටර් දැන්වීම් තරඟ, සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩ සටහන්, ප්‍රදර්ශන, පත්‍රිකා හා පොත් ප්‍රකාශයට පත් කිරීම, පස සහ වන සංරක්ෂණ වැඩ සටහන්, දූෂණ පාලන වැඩ සටහන් ආදි වූ විවිධ ක්‍රියාමාර්ග ආරම්භ කළේය. ඒවා නොකඩවා පැවැත්විණ. ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් ඉදිරියටත් පවත්වා ගෙන යනු ලැබේ. කිසියම් ප්‍රමාණයකින් පාරිසරික පිරිහීම මැඩ පැවැත්වීමට මෙම වැඩ සටහන් ඒකාන්තයෙන්ම ඉවහල් වන්නේය.

## ''එන්වයරන් ලංකා'' 92- ජාතික පාරිසරික ප්‍රදර්ශනය.

''එන්වයරන් ලංකා''92 නම් ප්‍රථම ජාතික පාරිසරික ප්‍රදර්ශනය, පරිසර සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ අගනගර පරිසර වර්ධන වැඩ සටහන, මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා විද්‍යාවර්ධන සංගමය යන ආයතනයන්හි සහයෝගය ඇතිව 1992 දෙසැම්බර් 10 සිට 12 වනදා දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත් වේ.

ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජයේ සහ පෞද්ගලික ආයතන යොමු කරවා ගැනීමට මෙම ප්‍රදර්ශනයෙන් බලාපොරොත්තු වේ. එහි අරමුණ නම් පාරිසරික දැනුවත්කම උසස් කිරීමත්, පරිසරයට හිතවත් තාක්ෂණ, උපකරණ, ද්‍රව්‍ය සහ සේවා පිළිබඳ මෙරටින් සහ පිටරටින් ලබාගත් දැනුම පැතිරවීමත්ය.

පරිසරය පිළිබඳ සාර්ක් කමිටුව-

පරිසරය පිළිබඳ සාර්ක් කමිටුවේ ප්‍රථම රැස්වීම බංග්ලාදේශයේ ඩකාහිදී පැවැත්විණ. එම රැස්වීමට ශ්‍රී ලංකාව වෙනුවෙන් සහභාගිවූයේ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති පී. තේ. අමරතුංග සහ පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ උපදේශක එල්. සී. ඒ. ද. එස්. වීජේසිංහ යන මහත්වරුය. මෙම කමිටු රැස්වීමට පැවරී තිබුණු ප්‍රථම කාර්ය වූයේ පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සම්මත කරගැනීම පිණිස සාර්ක් රටවල් දරන අදහස් පිළිබඳ ඒකමතිකභාවයක් ඇතිකර ගැනීමයි. පොදු ස්ථාවරයන් ගොඩ නගා ගැනීමේදී ශ්‍රී ලංකාව ඉදිරිපත් කොට තිබූ පත්‍රිකාව වෙසෙසින් ප්‍රයෝජනවත් විය. මේ රැස්වීමේ දී සකස්කර ගත් කෙටුම්පත 1992 අප්‍රේල් මාසයේ පැවැත්වෙන සාර්ක් පාරිසරික අමාත්‍ය රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණ.

සාර්ක් පාරිසරික අමාත්‍ය සමුළුව.

ඉහත සඳහන් රැස්වීම 1992 අප්‍රේල් මස අට සහ නවය (8-9) දෙදින නවදිල්ලි නුවරදී පැවැත්විණ. පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු ඇමති ගරු එම්. වින්සන්ට් පෙරේරා මහතා ප්‍රමුඛ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාව වෙනුවෙන් ඊට සහභාගි වූහ. පොදු වශයෙන් සංවර්ධනය වන රටවලට මුහුණ පෑමට සිදුවන, විශේෂයෙන් දකුණු ආසියානු රටවලට බලපාන පරිසරය හා සංවර්ධනය හා බැඳුණු ගැටළු පිළිබඳව මේ රැස්වීමේදී ඇමතිතුමා විශේෂ අවධානය යොමු කොට අදහස් ප්‍රකාශ කළේය. පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සම්මත කර ගැනෙන ප්‍රඥප්තිය මගින් දකුණු රටවල විශේෂ අවශ්‍යතා සහ සංවර්ධනය වන රටවල පරිසර හා සංවර්ධන වැඩ සටහන් සඳහා අවශ්‍ය සම්පත් සහ තාක්ෂණය සැපයීම සඳහා උතුරේ රටවලට ඇති වගකීම පිළිගත යුතු බව ඇමතිතුමා ප්‍රකාශ කළේය. මෙහිදී දකුණු ආසියානු රටවල් දරන මත ඇතුලත්වන පරිදි ඇමතිවරුන් කෙටුම්පත් ප්‍රකාශනයක් සකස් කළ අතර, එය පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට අදාළ ගැටළුවලට අනුකූල විය. එම කෙටුම්පත පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළු මහලේකම් කාර්යාලය වෙත යවන ලදී.

එක්සත් ජාතීන්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ සමුළුවට සූදානම්වීමේ හතරවැනි රැස්වීම.

මෙම රැස්වීමට ද ශ්‍රී ලංකාව සහභාගි විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත ආචාර්ය ස්ටැන්ලි කල්පගේ, පාරිසරික හා

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය බී. නේසයියා, අමාත්‍යාංශයේ උපදේශක එල්. විජේසිංහ, ඇමෙරිකාවේ ශ්‍රී ලංකා නියෝජ්‍ය තානාපති එම්. එම්. විජේතුංග යන මහත්වරු ඊට සහභාගි වූ නියෝජිත පිරිසට ඔහු අයත් වූහ. සංවර්ධනය වන රටවලට බලපාන තරණු සාකච්ඡා කෙරණු 77 කණ්ඩායමේ රැස්වීම් ඇතුළු සාකච්ඡා ගණනාවකට ඔවුහු සහභාගි වූහ.

පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව– (මිහිතල සමුළුව)

මේ සමුළුව 1992 ජූනි 01 දා සිට 15 දා රියෝ ඩී ජනෙයිරෝහිදී පවත්වන ලදී. ඊට සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසට ගරු අග්‍රාමාත්‍යතුමා, පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු ගරු ඇමතිතුමා සහ නිලධාරීහු ඇතුළත් වූහ. මිහිතල සමුළුව ඇමතූ අග්‍රාමාත්‍යතුමා දකුණු ආසියාවේ රටවලට පරිසරය හා සංවර්ධනය පිළිබඳ ගැටළු මෙහෙවින් බලපාන නිසා පොදුවේ මේ ගැටළු සම්බන්ධයෙන් වැඩි අවධානය යොමු කළේය. දකුණු ආසියාවේ පාරිසරික අමාත්‍යවරුන් විසින් සකස් කරන ලදුව පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළු මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කෙරණු ඒකාබද්ධ නිවේදන කෙටුම්පත ගැන ද එතුමා සඳහන් කළේය. අඛණ්ඩ සංවර්ධන ප්‍රවර්ධනයේදී සහ පරිසර කළමනාකරණයේදී දකුණු ආසියානු රටවල් මුහුණදෙන විශේෂ ගැටළු එතුමා ගෙනහැර දැක්විය. සමුළුව ඇමතූ පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ශ්‍රී ලංකාවේ පරිසරය හා සංවර්ධනයට අදාළ ගැටළු පිළිබඳ තරණු ඉදිරිපත් කළේය. පරිසරය හා සංවර්ධනය ආශ්‍රිත ප්‍රධාන ගැටළු විසඳීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග විස්තර කළ ඇමතිතුමා අපි මුහුණ පාන ප්‍රශ්න ද පෙන්වා දුන්නේය.

සංවර්ධන ක්‍රියාවලිය පාරිසරිකමය වශයෙන් ඵලදායී සහ කල්පවතින බව සහතික කරමින් දිළිඳු බව සහ එහි සහාය ප්‍රශ්න පිටුදැකීම පිණිස සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ශ්‍රී ලංකාවට සිදුවී තිබෙව බව ද එතුමා පැවසීය. සංවර්ධනය වන රටවලට අඛණ්ඩ සංවර්ධන අරමුණ සපුරා ගැනීමට සහායවීමේ අන්තර් ජාතික සහයෝගිතාවයේ නව ආරම්භය මිහිතල සමුළුව වන බවට ඇමතිතුමා විශ්වාසය පළ කළේය.

## දේශගුණික වෙනස හා ජෛව විවිධත්වය :

මේ සම්මුතිවලට පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු ගරු ඇමතිතුමා විහිතල සමුළුවේදී අත්සන් තැබීය. ශිවිසුම් රජය විසින් පිළිගනු ලැබීම සම්බන්ධයෙන් තීරණයට එළඹීමට පෙර මේ සම්මුති පිළිබඳව තවදුරටත් දැන් අධ්‍යයනය කළයුතුය. අමාත්‍යාංශය මගින් පිහිටුවන ලද කමිටු දෙකක් අධ්‍යයනය සිදු කරයි. පරිසරය සහ සංවර්ධනය පිළිබඳ සම්බන්ධීකරණ කණ්ඩායම සහ ජෛව විවිධත්ව සංරක්ෂණ සම්බන්ධීකරණ කණ්ඩායම එම කමිටු දෙකයි.

## අනතුරුදායක අපද්‍රව්‍ය දේශසීමා හරහා ගෙන යාම් රීම් පිළිබඳ බාසෙල් සම්මුතිය.

මේ සම්මුතිය අධ්‍යයනය කළ අමාත්‍යාංශය එය අනුමත කිරීම රටේ යහපතට හේතුවන බැවින්, අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයට නිර්දේශයක් කළේය. ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබිණ. අනුමත කිරීමේ බලය යෝගය අධිකාරීන් සතුය. 1992 අගෝස්තු 25 දා සිට ශ්‍රී ලංකාව මේ සම්මුතියේ පාර්ශවකරුවෙක් වෙයි.

----

**එල්කේඒ - 027 -නොරාඩ් පරිසර සහයෝගිතා වැඩ සටහන.**

1989 අගෝස්තු මස 14 වැනි දින ශ්‍රී ලංකා රජය සහ නෝර්වේ රජය අතර අත්සන් තබන ලද ගිවිසුමක් මත මේ වැඩ සටහන දියත් කෙරුණු අතර, එය 1990 සිට ක්‍රියාත්මක වේ. ගිවිසුම යටතේ මේ සඳහා නෝර්වේජියානු ක්‍රෝනර් දෙකෝටි හතලිස් ලක්ෂයක හෙවත් රුපියල් දොළොස් කෝටියක (1989 විනිමය අනුපාතය අනුව) ප්‍රදානයක් සැපයේ. වාර්ෂිකව පැවැත්වෙන උපදේශක රැස්වීම්වලින් පසුව අනුමත කෙරෙන ව්‍යාපෘති පදනම් කොට ගෙන සෑම වසරකම මුදල් ප්‍රතිපාදන වෙන් කෙරේ. වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති සමාලෝචනවලින් පසුව 1991 පැවති වාර්ෂික සමාලෝචන රැස්වීමේදී නොරාඩ් පරිසර වැඩ සටහන මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට පැවරීමට තීරණය කෙරිණ. එසේම විශේෂ ඒකකයක් මගින් වැඩ සටහනේ පරිපාලනය සිදු කිරීමට ද තීරණය කරන ලදි.

මූලික වශයෙන් ප්‍රධාන ක්ෂේත්‍ර 06 ක් යටතේ නොරාඩ් ප්‍රදාන සැපයිණ. 1991 අවසානය දක්වා අනුමත කෙරුණු ව්‍යාපෘති හා ඒ සඳහා වැය කිරීම් පහත සඳහන් වේ.

| | මුළු වෙන් කිරීම් ව්‍යාපෘති (1991 දක්වා) | නව ව්‍යාපෘති | වැය කිරීම් (1991 දක්වා) |
|---|---|---|---|
| 1. ආයතනික ගොඩනැගිලි හා පුහුණුව | 23969930<br>ව්‍යාපෘති 14 | 3547000<br>ව්‍යාපෘති 3 | 14443492 |
| 2. පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | 26374200<br>ව්‍යාපෘති 7 | 818000<br>ව්‍යාපෘති 3 | 11885188 |
| 3. පරිසර දූෂණය | 3600000<br>ව්‍යාපෘති 3 | 2230000<br>ව්‍යාපෘති 02 | 2543000 |
| 4. පරිසර අධ්‍යාපනය හා දැනුම්වත් කිරීම. | 10212000<br>ව්‍යාපෘති 6 | 880000<br>ව්‍යාපෘති 3 | 3601418 |
| 5. පරිසර පර්යේෂණ හා සැලසුම්කරණය | 2403000<br>ව්‍යාපෘති 4 | 1555000<br>ව්‍යාපෘති 3 | 683757 |
| 6. සොබා දහම සුරැකීම | 25095970<br>ව්‍යාපෘති 03 | 4700000<br>ව්‍යාපෘති 01 | 11101034 |
| 7. දිස්ත්‍රික් පාරිසරික ව්‍යාපෘති | 900000 | | |
| | 91655100 | 14630000 | 44257889 |

1992 අප්‍රේල් මාසයේ පැවති වාර්ෂික සමාලෝචන රැස්වීමේදී දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අමතරව නව ව්‍යාපෘති 15 ක් සහ දිස්ත්‍රික් පාරිසරික අනුයෝජන ආයතන යටතේ රුපියල් ලක්ෂ නවයක තවත් ව්‍යාපෘති නොරාඩ් වැඩ සටහන විසින් අනුමත කරන ලදී. එම රැස්වීමේදී 1992 වැඩ සැලැස්ම ද අනුමත කෙරිණි. මූල්‍ය ආකෘතිය රුපියල් දෙකෝටි අසූ ලක්ෂයක් වුවත් එය අභිබවා යමින් රුපියල් තුන්කෝටි 50 ලක්ෂයක වැඩ අනුමත කොට තිබේ. මේ වසරේදී ඉඩම් වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය නොරාඩ් ආධාර ලබාගැනීම සඳහා රුපියල් දෙකෝටි 10 ලක්ෂයක සිංහරාජ සංරක්ෂණ ව්‍යාපෘතියේ දෙවන අදියර සහ රුපියල් එක්කෝටි 70 ලක්ෂයක කතල්ස් සංරක්ෂණ ව්‍යාපෘතියේ දෙවන අදියර ඉදිරිපත් කළේය. ඉහත කී යෝජනා දෙකේ ප්‍රාරම්භක වැඩ සඳහා නොරාඩ් සංවිධානය දැනටමත් රුපියල් 47 ලක්ෂයක් මුදා හැරීමට එකඟවී සිටී.

නොරාඩ් සංවිධානය 1991 සිට කඩොලාන කළමනාකරණය සඳහා වූ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රුපියල් 1 කෝටි 31 ලක්ෂයක ව්‍යාපෘතියට ද සහාය වෙයි. 1991 දී යාල සිව්වැනි කොටස සංවර්ධන ව්‍යාපෘතිය (රුහුණු ජාතික වනෝද්‍යානය) අනුමත කෙරුණු අතර , එය රුපියල් 1 කෝටි 61 ලක්ෂයක් වැය වන පුළුල් වැඩ සටහනකි. 1991 දී මේ සඳහා රුපියල් 2171219 ක් වැය කෙරිණ. 1992 සඳහා මේ ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කොට ඇති මුදල රුපියල් හතලිස් හත් ලක්ෂ 70 දහසකි. 1992 ජූලි දක්වා රුපියල් 3868175 ක් වැය කොට තිබේ.

ව්‍යාපෘති සැලැස්මට ඉහතින් ඉදිරිපත් කළ සොබා දහම සංරක්ෂණ ව්‍යාපෘතිවල විශාලත්වය සැලකිල්ලට ගෙන සැප්තැම්බර් මාසයේදී නොරාඩ් ආධාර ඇතිව විශේෂ නේවාසික යුක්තියුක්ත ආකෘති ප්‍රවේශ වැඩ මුළුවක් සංවිධානය කරන ලදී. මෙය ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති කාර්යාංශයේ කාර්යසාධනය වැඩි කිරීම සඳහා අමාත්‍යාංශය ඇරඹූ කාර්යයන්ගෙන් එකකි.

එම ව්‍යාපෘති සඳහා සවිස්තරාත්මක ව්‍යාපෘති සැලසුම්කරණ ආකෘති දියුණු කෙරුණු අතර, ඒවා ප්‍රගති සමාලෝචන දර්ශක සමග සිදු කෙරුණු බැවින්, මේ ව්‍යාපෘතිවල කාර්ය සාධනයේ විශාල වැඩි දියුණුවක් ඇති විය.

1992 දී සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම අතින් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගත් අතර, දැනටමත් නොරාඩ් වෙතින් එලදායී ප්‍රතිචාරයක් ලැබී තිබේ. 1993 දී රුපියල් හාර කෝටියක් දක්වා වැඩි කෙරුණු අරමුදල් අපේක්ෂා කළ හැකිය.

## ස්වාභාවික සම්පත් හා පාරිසරික ප්‍රතිපත්ති ව්‍යාපෘතිය ( නරෙප් )

මේ ව්‍යාපෘතිය ආරම්භ වූයේ 1991 අවසාන මාස තුන ඇතුළතය. පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ පුහුණුවක් ලබාදීම ද පාරිසරික සකසුරුවම් ද උපකරණ මිලට ගැනීම ද මඟින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජ්‍යායතන රැසක පාරිසරික කළමනාකරණ හැකියාව ඉන් ශක්තිමත් කරනු ලැබ ඇත. සහභාගි වන නියෝජ්‍යායතනවල අනුමත වාර්ෂික වැඩ සැලසුම් යටතේ වූ සැලසුම්ගත කටයුතු "නරෙප්" සම්බන්ධීකරණ කමිටුව මඟින් අධීක්ෂණය කෙරේ.

ශ්‍රී ලංකාවේ රථවාහන මඟින් සිදුවන වායු දූෂණය පිළිබඳ වීඩියෝ පටයක් සම්පූර්ණ කරනු ලැබූ අතර "මීහිතල සමුළුව" නිමිත්තෙන් දියත් කරනු ලැබූ සති දෙකක වායු දූෂණ ක්‍රියාත්මක ව්‍යාපාරය හා සමග එකවිට ක්‍රියාත්මක වනසේ 1992 ජුනි මාසයේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මඟින් එය ප්‍රදර්ශනය කරන ලදි. තවද, පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ වීඩියෝ චිත්‍රපටයක් නිම කරන ලදි.

### පාරිසරික බලපෑම් තක්සේරු රෙගුලාසි.

රාජ්‍ය නොවන සංවිධාන හා කර්මාන්ත කරුවන් විසින් ඉදිරිපත් කෙරෙන නියෝජනයන් සඳහා ඉඩ ලබා දෙනු පිණිස නීති කෙටුම්පත් සම්පාදක විසින් දැන් රෙගුලාසි සංශෝධනය කැර ගෙන යනු ලැබේ. පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාත්මක කිරීමට පෙර, බලපෑමට ලක්වූ පාර්ශ්වයන් අතර සම්මතියක් තහවුරු කර ගැනීම අමාත්‍යාංශයේ අභිලාෂයයි. එබැවින්, පාරිසරික බලපෑම් තක්සේරු පිළිබඳ කෙටුම්පත් රෙගුලාසි ගැන තවදුර අදහස් දැක්වීම සඳහා ඒවා රාජ්‍ය නොවන සංවිධාන වෙත සහ රාජ්‍ය ආයතන වෙත ද ඉදිරිපත් කරන ලදි.

### පාරිසරික කරුණු පිළිබඳ පැමිණිලි.

පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයෙන්ම සිදුවන දූෂණ සහ පීඩා පිළිබඳව මහජනයාගෙන් සහ රාජ්‍ය නොවන සංවිධාන කෙරෙන් ලැබෙන පැමිණිලිවල ස්වභාවය හා සංඛ්‍යාව වැඩිවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබිණ. 92.11.03 දින දක්වා පැමිණිලි 188 ක් අමාත්‍යාංශයට ලැබී තිබුණි. අමාත්‍යාංශය වෙත ලැබුණු පැමිණිලි මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරීක්ෂා කරනු ලැබූ අතර සිද්ධීන් රැසක් ම, නඩු පැවරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් භාර ගන්නා ලදි. මේ සිද්ධීන් සම්බන්ධයෙන් නීතිපතිගෙන් නීතිමය උපදෙස් ඉල්ලා ඇත. කාර්මික ආරක්ෂණ බලපත්‍ර

යෝජනා ක්‍රමය ප්‍රාදේශීය බල මණ්ඩලවලට පැවරීම සඳහා අමාත්‍යාංශය ක්‍රියා කරගෙන යයි. ලැබෙන පැමිණිලි සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගත හැකි තත්ත්වයක් ඇති කර ගැනීමට මෙමගින් හැකිවනු ඇත.

## විමධ්‍යගත කිරීම.

පරිසරය හා සංවර්ධනය කෙරෙහි මහජන සහභාගිත්වය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව, එක් එක් ප්‍රාදේශීය බල මණ්ඩලයක "ප්‍රාදේශීය පරිසර සභා" පිහිටුවීමට ප්‍රාදේශීය මට්ටමින් "ප්‍රාදේශීය පාරිසරික මෙහෙයුම් කමිටු" පිහිටුවීමටත් අමාත්‍යාංශය කටයුතු කරගෙන යයි. පවරාදීමේ කාර්ය පරිපාටියක් අමාත්‍යාංශය විසින් දැනටමත් සකස් කරනු ලැබ ඇති අතර, ප්‍රාදේශීය බල මණ්ඩලවලට පාරිසරික කාර්යයන් පවරාදීම පිළිබඳව තම එකඟත්වය සඳහා පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්ගේ අදහස් විමසන ලදි.

තවද, 92.09.04 වැනි දින පැවැත්වුණු සම්මන්ත්‍රණයකදී, පාරිසරික කාර්යයන් විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් නගරාධිපතිවරුන්ගේ, උප නගරාධිපතිවරුන්ගේ, ප්‍රාදේශීය සභාවල හා නගර සභාවල සභාපතිවරුන්ගේ සහ උප සභාපතිවරුන්ගේ ද අදහස් සලකා බලන ලදි. මේ පවරාදීමේ වැඩ පිළිවෙල ඉක්මනින් ම ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

**ප්‍රචණ්ති හා ප්‍රචාරක අංශය**

පරිසරය ආරක්‍ෂා කර ගැනීමේදී පරිසර විද්‍යාත්මක කරුණු සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම වඩාත් අර්ථවත් වනු ඇත. ජනතාව පරිසර සංරක්‍ෂණයේදී සහ සංවර්ධනයේදී ක්‍රියාත්මක ලෙස සහභාගී වන්නේ ඔවුන් තුල පරිසර **සංවේදිතාවත්** හා අවබෝධයත් ඇත්නම් පමණි.

පාරිසරික දැනුම හා අවබෝධය ජනතාව තුල ඇති කිරීම සඳහා අමාත්‍යාංශය මගින් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කළ සන්නිවේදන ව්‍යාපෘති රාශියක් වේ.

නවතම පාරිසරික විද්‍යාත්මක හා පාරිසරික දැනුම් සම්භාරය ක්ෂණිකව මෙන්ම කාර්යක්‍ෂමවද මහජනතාව වෙත සන්නිවේදනය කිරීමේදී රූපවාහිනිය, ගුවන් විදුලිය සහ පුවත්පත් වැනි ජනමාධ්‍යයන්ගේ සහාය ලබාගෙන ඇත. මෙය වඩාත් ව්‍යාප්ත කිරීම සඳහා පුද්ගලාන්තර සන්නිවේදන ක්‍රමෝපායයන් හා කණ්ඩායම් සන්නිවේදන ඇතුළු පාරම්පරික සන්නිවේදන ආකෘති ද උපයෝගී කරගනු ලැබීය. ඇතැම් වැඩ සටහන් නියමු ව්‍යාපෘතියක ස්වරූපයෙන් යුතු ඒවා බව ද සැලකිය යුතුය. එමගින් ලබන අත්දැකීම් ජාතික මට්ටමේ ඉදිරි වැඩ සටහන් සැලසුම් කිරීමේදී වඩාත් උපකාරී වනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.

**රූපවාහිනී වැඩ සටහන්.**

සමාලෝචිත වර්ෂය තුළ රූපවාහිනී දැනුම මිනුම වැඩ සටහනක් රූපවාහිනී සංස්ථාවේ අනුග්‍රහය යටතේ අමාත්‍යාංශය විසින් නිෂ්පාදනය කර විසිර්ජනය කරන ලදි. ශ්‍රී ලංකා රූපවාහිනී විකාශනයක් මගින් පරිසර දැනුම මිනුම පිළිබඳ වැඩ සටහනක් ප්‍රචාරය වූ පළමුවැනි අවස්ථාව මෙයයි. දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද මෙම වැඩ සටහනට සෑම පළාතකින් ම ලැබුන ප්‍රතිචාරය ඉතා විශිෂ්ඨ ය.

පය සෝදා පාළුව සහ නායයෑම් වළක්වා ගැනීමේ ප්‍රායෝගික ආරක්‍ෂණ ක්‍රමයක් වශයෙන් සැලකිය හැකි මුල් බහුල ශාඛයක් වන ඌණ වැවීමට ජනතාව උනන්දු කිරීමේ වැඩ පිළිවෙලට අනුබලයක් වශයෙන් අමාත්‍යාංශය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සම සහයෝගිතාව ඇතිව විශේෂ වාර්තාමය රූපවාහිනී චිත්‍රපටයක් නිෂ්පාදනය කරන ලදි. විශිෂ්ඨතම රූපවාහිනී වාර්තා චිත්‍රපටයට හිමිවන 'උත්ඩා' සම්මානය ද මෙම චිත්‍රපටයට මේ වසරේ හිමිවිය. මේ චිත්‍රපටයේ පිටපත අමාත්‍යාංශයේ ප්‍රචණ්ති හා ප්‍රචාරක අංශය මගින් ලියා සපයන ලද්දකි.

මීට අමතරව ජාතික පාරිසරික සැලැස්ම සම්බන්ධව මෙන්ම කාලීන පාරිසරික වැදගත්කමක් ඇති කරුණු පිළිබඳ රූපවාහිනී සාකච්ඡා කිහිපයක් ද අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ රූපවාහිනිය මඟින් විසිරණය කෙරිණි.

## ගුවන් විදුලි වැඩ සටහන්.

තත්කාලීන පාරිසරික වැදගත්කමක් ඇති අවස්ථා හා කරුණු කේන්ද්‍ර කර ගෙන ගීතමය හා වාර්තාමය ගුවන් විදුලි වැඩ සටහන් රාශියක් මේ වසර තුළදී ගුවන් විදුලියෙන් ප්‍රචාරය කෙරිණි.

ප්‍රජා ගුවන් විදුලි සේවාවන්ගේ සහාය ලබා ප්‍රාදේශීය මට්ටමේ ගුවන් විදුලි වැඩ සටහන් රාශියක් නිෂ්පාදනය කිරීමේ අවස්ථාව අමාත්‍යාංශයට ලැබිණ. ප්‍රජා ගුවන් විදුලිය පාරිසරික කරුණු ග්‍රාමීය ප්‍රජාවට වඩාත් සමීප ලෙස ඉදිරිපත් කිරීමේදී උපයෝගී කරගත හැකි ප්‍රධාන සන්නිවේදන මාධ්‍යයක් බව මෙමඟින් ලද ප්‍රතිචාරය හා අත්දැකීම් අනුව සඳහන් කළ හැකිය.

## පරිසර ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් බහුතරය තවමත් ජීවත් වන්නේ ගම්දනවු වලය. මේ නිසා ජාතික මට්ටමේ සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදනයේදී ගම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ. ග්‍රාමීය ජනතාවගේ උත්සාහය සහ උනන්දුව සංවර්ධන ක්‍රියාවලියට මෙන්ම පරිසර සංරක්ෂණය උදෙසා ද යොමු කරවා ගැනීම අර්ථවත් කාර්යයකි.

පරිසර ආදර්ශ ගම්මාන නියමු ව්‍යාපෘතිය ගම මුල්කර ගෙන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන පරිසර සංරක්ෂණ හා සන්නිවේදන වැඩ පිළිවෙලේ එක් අංගයකි.

## ව්‍යාපෘතියේ ස්වභාවය

ගම මුල් කරගත් සන්නිවේදන ව්‍යාපෘතියකි. පරිසර සංරක්ෂණය සහ ස්වාභාවික සම්පත් කළමණාකරණයේදී ජනතාවගේ ක්‍රියාකාරී සහභාගිත්වය ලබා ගැනීම මෙහි මූලික අරමුණයි. ගමේ ස්වාභාවික පරිසරය මෙන්ම සංස්කෘතික පරිසරය කෙරෙහි අවධානයක් යොමු කිරීම මෙම වැඩ පිළිවෙලේ තවත් ලක්ෂණයකි. ග්‍රාමීය ප්‍රජාවගේ පාරම්පරික සාරධර්ම හා පරිසර භක්තිය වර්ධනය කිරීම මෙම වැඩ පිළිවෙලේ සුවිශේෂ අංගයකි.

## අරමුණු

1. ග්‍රාමීය සංවර්ධනයේදී පාරිසරික සංවර්ධනය පිළිබඳව වඩාත් අවධියෙන් සිටීමට ජනතාව දැනුවත් කිරීම.

11. ග්‍රාමීය ජනතාවගේ පාරිසරික අවබෝධය හා අවධානය වර්ධනය කිරීම.

111. සෑම ගම්වැසියෙකුටම පරිසර නිරීක්ෂකයෙකු බවට පත්වීමට අවස්ථාව සැලසීම.

1V. පරිසරය සුරකින අතරම අතිරේක ආදායම් ලබා ගැනීමේ ව්‍යාපෘති හා ස්වයං රකියා හඳුන්වාදීම. (උද්‍යාන විද්‍යාව, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, වන වගා, අප ද්‍රව්‍ය ප්‍රතිභාවිතය හා කඩදාසි නිෂ්පාදනය.)

V. ස්වාභාවික සම්පත් පරිහරණය සහ කළමනාකරණය මෙන්ම පරිසර සංරක්ෂණය සඳහා ද පාසල් සිසුන් යොමු කරවා ගැනීම.

V1. පාසල් සිසුන් ඉදිරි කිරීමට හා පරිසර සංරක්ෂණයට යොමු කෙරෙන තුරුලතා බැංකු හඳුන්වාදීම.

ස්වයං රකියා

පරිසරය සුරැකෙන අතරම, ඇරඹිය හැකි විවිධ වූ ස්වයංරකියා මාර්ග කෙරෙහි ජනතාව යොමු කිරීම ද මේ යටතේ සිදු වේ. මී මැසි පාලනය, ග්‍රාමීය වන වගාව, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, මල් වැවීම, ගෙවතු වගාව, බිම්මල් වගාව සහ එළවළු සහ පළතුරු කල් තබා ගැනීම ආශ්‍රිත ව්‍යාපෘති, ජීවවායු ඒකක, දර පිරිමැසුම් ලිප් හඳුන්වාදීම වැනි ආර්ථිකමය ප්‍රතිලාභ ගෙන දෙන විවිධ ව්‍යාපෘති ආරම්භ කිරීමට ජනතාව දැනුවත් කෙරේ.

අධ්‍යාත්මික හා සංස්කෘතික සංවර්ධනය.

ස්වාභාවික පරිසරය මෙන්ම සංස්කෘතික පරිසරය ද ප්‍රජාවට හිතකර අන්දමින් පවත්වා ගෙන යාම සහතික කිරීම මෙම වැඩ පිළිවෙලේ තවත් අංගයක් වේ.

පාරිසරික ගම්මාන.

පළමුවෙනි පාරිසරික ගම්මානය මහනුවර දිස්ත්‍රික්කයේ පේරාදෙණියේ පහළ රජියගම ගොඩගංදෙණියේදී පසුගිය අප්‍රේල් මාසයේ ආරම්භ කෙරිණි. මෙහි දැනටමත් කොම්පෝස්ට් පොහො නිෂ්පාදනය, ගෙවතු වගා, සහ අධ්‍යාපනික සම්මන්ත්‍රණ හා වැඩ මුළු වැනි ව්‍යාපෘති ශක්තිමත් ක්‍රියාත්මක කර ඇත. මේ ගම මායිමේ මහවැලි ගඟට අපද්‍රව්‍ය බැහැරලීම සීමා කිරීමට පරිසර ගම්මානය මඟින් කටයුතු කිරීම ඉතා වැදගත් ය.

දෙවැනි පාරිසරික ගම්මානය ඇහැළියගොඩ විකුම්සිංහගමේ ඔක්තෝබර් මාසයේදී ශ්‍රීමත් ජනාධිපතිතුමා විසින් විවෘත කරන ලදී. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා නව ක්‍රමයක් වශයෙන් බැරල් ක්‍රමය හඳුන්වාදීමත්, ඉන්ධන පිරිමැසුම් ලිප් සහ බෙහෙත් පැළෑටි වගාව හඳුන්වා දීමත් එහි දැනට ක්‍රියාත්මක කෙරේ.

## ඌණ වගා ව්‍යාප්ත කිරීම.

තදුතර ප්‍රදේශවල සෝදා පාලුව වැළැක්වීමේ ස්වභාවික උපක්‍රමයක් වශයෙන් ඌණගස් සිටුවීම මහනුවර දිස්ත්‍රික්කයේ ව්‍යාප්ත කිරීමට විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

## මහමෙවුනා උයනේ නැවත ගස් සිටුවීම.

වයස්ගතවීම සහ වෙනත් හේතූන් නිසා උයනේ ගස් මැරියාමට ඉඩ තිබෙන බැවින්, එහි සුදුසු ගස් සිටුවීමට වැඩ සටහනක් යෝජනා කර ඇත. මේ පිළිබඳව අනුරාධපුර දිස්ත්‍රික් පරිසර අනුයෝජිත කමිටුව මගින් අනුරාධපුර බන්ධනාගාර භූමියේ දැනටමත් පැල තවානක් ආරම්භ කර ඇත. මේ සඳහා ප්‍රවෘත්ති සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයද, මධ්‍යම සංස්කෘතික අරමුදලද ආධාර කිරීමට නැමැත්ත පල කර ඇති අතර, ඉදිරි වසරේදී තවත් ආයතනවල සහයෝගය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

## පාරිසරික අධ්‍යයන කේන්ද්‍රය.

1992 මාර්තු මාසයේදී රජරට ගුවන් විදුලි සේවයේ විශේෂ අනුග්‍රහය ඇතිව අනුරාධපුරයේ පරිසර අධ්‍යයන කේන්ද්‍රයක් පිහිටුවනු ලැබීය. මේ හැර ජනාධිපති ජංගම සේවයම අනුබද්ධව වවුනියාවේ දෙමළ මහා විද්‍යාලයේ පරිසර අධ්‍යයන වැඩ සටහනක් සහ බිතු සිතුවම් චිත්‍ර තරඟයක් පවත්වන ලදි.

පාරිසරික විද්‍යාඥයින්, මාධ්‍යවේදීන් සහ කලාකරුවන් එක්රැස් කර ඔවුන් අතර දැනුම හුවමාරු කර ගැනීමේ පහසුකම් සැලසෙන සම්මන්ත්‍රණයක් හා වැඩ මුළුවක් ඔක්තෝබර් 31 සහ නොවැම්බර් 01 වන දින මහනුවර මුලික අධ්‍යයන ආයතනයේදී පැවැත්වූ අතර, සහභාගිවූවන් කලාත්මක හා සාහිත්‍යමය වශයෙන් නව නිර්මාණ එහිදී ඉදිරිපත් කිරීම විශේෂ සිද්ධියක් වශයෙන් සඳහන් කල හැකිය.

## පාරිසරික සාහිත්‍යය.

ප්‍රවෘත්ති හා ප්‍රචාරණ අංශයේ ප්‍රකාශන වැඩ පිළිවෙලට දේශීය හා අන්තර් ජාතික පරිසරවේදීන්ගේ ප්‍රසංශාව හිමිවන අයුරින් 'සොබා' පාරිසරික සඟරාව සහ තවත් කාලීන වැදගත්කමක් ඇති පොත්පත් ප්‍රකාශයට පත්කොට ඇත. මෙහිලා මිහිතල සමුළුවට ඉදිරිපත් කළ 'සොබා' සඟරාවේ විශේෂ කලාපයක් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා ලියූ 'ජලය හා සංස්කෘතිය නම් පොතත්, මහාචාර්ය විමල් දිසානායක මහතා සහ සුනිල් සරත් පෙරේරා මහතා එක්ව ලියූ 'පරිසරය, පුද්ගලයා හා සන්නිවේදනය ' පොතත් විශේෂ වේ. මේ ග්‍රන්ථ මිහිතල සමුළුවේ විශේෂ අවධානයට යොමු වූ බව මෙහිලා සඳහන් කිරීම වැදගත් ය.

## ප්‍රතිචක්‍රීයකරණය.

ප්‍රතිභාවිතය හා ප්‍රතිචක්‍රීයකරණය පිළිබඳව ජනතාවට අවබෝධය ලබාදෙන විශේෂ වැඩ සටහනක් සැලසුම් කෙරේ. කොම්පෝස්ට් පොහොර සෑදීමේ 'බැරල්ක්‍රමය' , ඉවතලන කඩදාසි, වීදුරු වැනි දෑ නැවත ප්‍රයෝජනයට ගැනීමට හුරු කිරීම මීළඟ විශේෂ වේ. මේ හැර මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් 15 ක සිසුන් අතර දැනට ක්‍රියාත්මක වන පැලතවාන් පවත්වා ගෙන යෑමේ ව්‍යාපෘතිය යටතේ එම පැල විකුණා ලැබෙන මුදල් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කිරීමට අවස්ථාව සලසාදීමේ වැඩ සටහනද ජනප්‍රියත්වයට පත්වී ඇත. මෙය ද්විත්ව ඉතිරි කිරීමේ වැඩ සටහනක් ලෙස ද සැලකිය හැක.

## පාර්ලිමේන්තු කටයුතු

ඉහත සඳහන් කාල පරිච්ඡේදය තුළදී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පහසුකම් ලබාදීමත් පාර්ලිමේන්තු කටයුතුවලට අදාළ ව පාර්ලිමේන්තුවේ විවිධ අංශ හා සමග කටයුතු සම්බන්ධීකරණය කිරීමත් පිළිබඳ වැඩ පාර්ලිමේන්තු කටයුතු රාජ්‍ය අමාත්‍ය කාර්යාලය විසින් සිදු කරන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලයට ලිපිකරුවන්, යතුරු ලේඛකයන් සහ කාර්යාල කාර්ය සහායකයන් පත් කිරීමත් ඔවුන්ට වැටුප් සහ දීමනා ගෙවීමත් සිදු කරන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු ව සිටින්නන්ට වැටුප් වශයෙන් රු. 15,934,576/= ක මුදලක් ගෙවන ලදී. ගමන් වියදම් වශයෙන් ඔවුන්ට ගෙවන ලද මුදල රු. 5,53,472/= කි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කරනු ලැබූ නිලධාරීන්ට, සේවය කළ එක් එක් මාසයට මාසික වැටුපෙන් 20% ක් වන පදනම මත ගණන් බලන ලද පාරිතෝෂික මුදලක් ගෙවන ලදී. අදාළ කාලසීමාව තුළ එසේ ගෙවනු ලැබූ පාරිතෝෂික මුදල් ප්‍රමාණය රු. 7,64,644/= ක් විය.

මේ කාලසීමාව තුළදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිලධාරීන්ට හැඳුනුම් පත් හයක් නිකුත් කරනු ලැබිණ.

මේ අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, සහනශීලී පදනමක් මත, ශ්‍රී ලංකා රාජ්‍ය වණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් යතුරු ලියන, ජායාස්ථිත යන්ත්‍ර සහ පිටපත් ඡනිවුඩ යන්ත්‍ර (ෆැක්සිමිලි) ලබාදෙන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 15 දෙනකුට මෙකී පදනම මත ෆැක්සිමිලි යන්ත්‍ර නිකුත් කරනු ලැබ ඇති අතර, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින් කරන ලද නිර්දේශය මත සෙසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 210 දෙනාට ද තීරු බද්දෙන් නිදහස් ෆැක්ස් යන්ත්‍ර ලබාදීමට ක්‍රියා කරගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය වණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තම නිලවාහන සඳහා සහනදායක මිලට ටයර් සහ ටියුබ් ලබාදීම පිළිබඳ සම්බන්ධීකරණය මේ අමාත්‍යාංශය විසින් සිදු කරන ලදි.

පස් අවුරුදු සේවා කාලයක් නොමැති බැවින් විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 15 දෙනකුට පාරිතෝෂිත දීමනාවක් ගෙවීමට 1990 මැයිමස 02 වැනි දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදි. ඉන්පසුව 92.03.16 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සෙසු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ද පාරිතෝෂිතයක් ප්‍රදානය කිරීම පිළිබඳව තවදුරටත් පරීක්ෂා කොට අමාත්‍ය මණ්ඩලයට වාර්තා කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරන ලදි.

# මධ්‍යම පරිසර අධිකාරිය

## පරිසර සංරක්‍ෂණ අංශය

1. **ශ්‍රී ලංකාව සඳහා වූ ජාතික ව්‍යසන පරිපාදිත සැලැස්ම (කාර්මික අනතුරු)**

ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවේ වැඩ සම්බන්ධීකරණය කරන ලදි. මෙකී කාලසීමාව තුළ කමිටුව රැස්වීම් කිපයක් පැවැත්විය. ශ්‍රී ලංකාවේ විභව්‍ය ලෙස උපද්‍රවකාරී වන කර්මාන්ත සවි කිරීම් කවරේදැයි කමිටුව විසින් හඳුනාගනු ලැබ ඇත. මෙකී උපද්‍රවකාරී කර්මාන්තවල පරිපාදිතභාවය පිළිබඳ තත්ත්වය තක්සේරු කිරීම සඳහා වූ ප්‍රශ්න මාලාවක් පිළියෙල කිරීම සිදු කරනු ලැබ ඇති අතර, අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා එය අදාළ ආයතන අතර බෙදා හරින ලදි.

2. **හරිතාගාර ආවරණය පිළිබඳ සාන් වාර්තාව.**

මේ කාලසීමාව තුළදී ඉහත කී වාර්තාව නිම කරන ලදි.

3. **වාහන විමෝචන තෙරෙන් සිදුවන දූෂණය පාලනය කිරීම.**

(අ) අවුරුද්දේ මුල් මාස පහ තුළදී පහත දැක්වෙන පරාමිතීන්ට අනුව කොළඹ නගරයේ වායු තත්ත්වය මනින ලදි.

- කාබන් මොනොක්සයිඩ්
- සල්ෆර් ඩයොක්සයිඩ්
- නයිට්‍රජන් ඩයොක්සයිඩ්
- පූර්ණ හයිඩ්‍රෝකාබන්

නෙදර්ලන්ත ආධාර ලබන ව්‍යාපෘතිය යටතේ පිළියෙල කරන ලද යෝජිත පරිවෘත වායු තත්ත්ව ප්‍රමිතීන් පිළිගත හැකි බව මේ අධ්‍යයනයෙන් ලබා ගන්නා ලද ප්‍රතිඵලවලින් පෙනී ගොස් ඇත.

(ආ) **වාහන විමෝචන පාලනය කිරීම සඳහා ධූම මානක යන්ත්‍ර මිලදී ගැනීම.**

ධූම මානක යන්ත්‍ර සඳහා සුදුසු පිරිවිතර පිළියෙල කිරීම උදෙසා ලේඛන සහ කාර්මික ආධාර කාරක සභිකයකු වශයෙන් දෙන ලදි. වාහන තෙරෙන් දුම් නිකුත්වීම පිළිබඳ ප්‍රමිතීන් ද සකස් කරන ලදි. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩලයට ධූම මානක මිලදී ගැනීම සඳහා උදව් කරන ලදි.

4. **ප්‍රාදේශීය හා ර්මිත සේවා කමිටුව.**

ඉහත කී කමිටුවලට සහභාගිවීමෙන් සහාය දෙන ලදී. මෙකී කමිටු කාර්මික ප්‍රවර්ධන පනත යටතේ ඇති කරන ලද්දේ ඒ ඒ ප්‍රදේශ තුළ කාර්මීකරණය පහසු කිරීම සඳහා ය.

5. **ප්ලාස්ටික් (භාවිතය හා අපහරණය) තෙරෙන් සිදුවන දූෂණය පාලනය කිරීමේ උපාය මාර්ග.**

ප්ලාස්ටික් අපහරණය පිළිබඳවත්, ආහාර වර්ග ගබඩා කොට තැබීමේදී උපප්‍රමාණිත ප්ලාස්ටික් වර්ග භාවිතයට ගැනීම පිළිබඳවත් අනාගත උපායවර්ග අධ්‍යයනය කිරීමට ක්‍රියා කොට ඇත. අධ්‍යයනය අවසාන සුදුසු උපාය මාර්ගයන් සකසනු ලබනවා ඇත.

6. **ක්ලෝරෝෆ්ලුරෝකාබන් සහ වෙනත් උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය ආනයනය.**

ඕසෝන් ස්තරය ක්ෂය වී පාලනය කිරීමේදීත් උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය රට තුළට ඇතුළුවීම පාලනය කිරීමේදීත් මුහුණ පෑමට සිදුවන ගැටළු අධ්‍යයනය කිරීම සඳහා ක්‍රියා කරන ලදී. රට තුළට ආනයනය කෙරෙන රසායන ද්‍රව්‍ය පිළිබඳ දත්ත පදනමක් පිළිවෙල කිරීමට ක්‍රියා කොට ඇත.

7. **නුවර වැවේ ජල තත්ත්ව සමීක්ෂණය.**

නුවර වැවේ ජල තත්ත්වය මාස්පතා සමීක්ෂණය කිරීම වරින් වර සිදු කරන ලදී. පහත සඳහන් පරාමිතීන් සඳහා නියමිත ස්ථාන 13 කින් ලබාගන්නා ලද නියැදි විශ්ලේෂණය කරනු ලබමින් පවතී. PH , ද්‍රාවිත ඝන ද්‍රව්‍ය, රසායනික ඔක්සිජන් ඉල්ලුම, ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම, නයිට්‍රේට් සහ පොස්පේට්.

නුවර වැවේ ජලයේ තත්ත්වය හොඳ බැව් විශ්ලේෂණයෙන් පෙන්නුම් කෙරේ.

8. **නුවරඑළිය, ග්‍රෙගරි වැවේ ජලය මාසිකව නියැදිගත කිරීම.**

නුවර එළිය, ග්‍රෙගරි වැවේ ජල තත්ත්වය මාස්පතා සමීක්ෂණයට භාජනය කරනු ලැබේ. නියමිත ස්ථාන 8 කින් නියැදි ඒක්තර ගනු ලැබේ. ජල නියැදි පහත දැක්වෙන පරාමිතීන් සම්බන්ධයෙන් පිරික්සනු ලැබේ. PH , ද්‍රාවිත ඔක්සිජන්, රසායනික ඔක්සිජන් ඉල්ලුම, ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම, නයිට්‍රේට්, පොස්පේට් සහ පූර්ණ ඝන ද්‍රව්‍ය. ජලයේ ඇති නයිට්‍රේට් සහ පොස්පේට් මට්ටම් අධික බැව් ප්‍රතිඵලවලින් දැක්වේ.

9. <u>බේරේ වැවේ සහ සත්ත බස්තියන් ඇලේ ජල තත්ත්ව සමීක්ෂණය.</u>

නිශ්චිත ස්ථාන 14 කින් ලබාගත් නියැදි සෑම සති දෙකකට වරක් විශ්ලේෂණය කරනු ලැබිණ.

10. ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක තුළ කපාපු පොල් මෝල්වලින් ගත් ජල නියැදි පරීක්ෂා කරන ලද අතර ඒවායේ තත්ත්වය මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුකූල නොවන බැව් පෙනී ගියේය.

11. රසායනාගාර විශ්ලේෂණයට භාජනය කරන ලදි. පහත සඳහන් කර්මාන්තශාලා තෙරෙන් යන අපවාහයන් විශ්ලේෂණය කරනු ලැබිණ.

<u>කොළඹ</u>

ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්

හෝමාගම කැල්වනයිස් යන්ත්‍රාගාරය

හෝමාගම සී/ස. හේ–කෙමි

හංවැල්ල පීමාසහිත රබර් ප්‍රොඩක්ට්ස්

සිංගර් ලංකා සල්පියුරික් ඇසිඩ් ප්ලාන්ට්

පියෝ බෙවරේජස් යන්ත්‍රාගාරය

තවුවෙල එලිපන්ට් හවුස් යන්ත්‍රාගාරය

රත්මලාන රෙදි කම්හල්

රත්මලාන බැටරි කම්හල

මොරටුව ටයර් රිට්‍රේඩිං පැක්ටරි

රත්මලාන ඇස්බෙස්ටෝස් යන්ත්‍රාගාරය

මැකලම් බ්‍රැවරි/මහවැලි මැරයින් සිමෙන්ති යන්ත්‍රාගාරය

<u>ගම්පහ</u>

පූගොඩ රෙදි කම්හල

මිගමුව කපාපුපොල් කම්හලේ පොල්කටු (අඟුරු) පිරිස්සීමේ යන්ත්‍රාගාරය

<u>මහනුවර</u>

සිටඩෙල් හෝටලය

මැකෝ සර්විස් ස්ටේෂන්

නාවලපිටිය සර්විස් ස්ටේෂන්

කෑගල්ල

මාවනැල්ල ස්ක්‍රේප් රබර් කම්හල

මාවනැල්ල බ්ලොක් රබර් කම්හල

තුල්හිරිය කාබුල් ලංකා රෙදි කම්හල

නුවරඑළිය

සිලෝන් බෲවරී

සර්විස් ස්ටේෂන්– රාගල

රත්නපුර

ඇඹිලිපිටිය පේපර් මිල්ස්

කුරුණෑගල

සෙරන්ඩිබ් ඩී.සී.මිල්ස්

බෝයගනේ ඩී.සී.මිල්

ගාල්ල

සිමෙන්ති කම්හල

මාතර

දෙවිනුවර–ටැම් ලංකා පොලියුරතින් යන්ත්‍රාගාරය

තාවින්න ගල්වල

12. බේරේ වැව ප්‍රතිසංස්කරණය

බේරේ වැව ඉවුරේ පිහිටි පහත සඳහන් කර්මාන්තවල නියෝජිතයන් සමග, වැවට දූෂක ද්‍රව්‍ය මුදාහැරීම සම්බන්ධයෙන් මාස්පතා සාකච්ඡා පවත්වනු ලැබේ.

(අ) එලිපන්ට් හවුස් (සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස්)

අපවාහ අපහරණ ක්‍රම පිළිබඳ අඩු ලුහුඩුකම් 93.01.31 වන විට නිම කෙරෙනු ඇත.

(ආ) සීමාසහිත ලීවර් බ්‍රදර්ස් සිලෝන්

අපවාහ ප්‍රතිකර්ම යන්ත්‍රාගාරයක් සවිකිරීම සඳහා ක්‍රියා කර ඇත. ආරම්භ කිරීමේ ඉලක්ක දිනය – 1993 සැප්තැම්බර්

(ඇ) සීමාසහිත බී.සී.සී.

දූෂක ද්‍රව්‍ය මුදාහැරීම පාලනය කිරීම සඳහා ක්‍රියා කරන ලෙස ඉල්ලා ඇත.

(ඈ) සිලෝන් සින්තටික් ටෙක්ස්ටයිල් මිල්ස් ලිමිටඩ්

අවශ්‍ය ප්‍රතිකර්ම පහසුකම් සවි කිරීම සඳහා ක්‍රියා කරන ලෙස ඉල්ලා ඇත.

(ඉ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
(කොලොන්නාව)

අවශ්‍ය ප්‍රතිකර්ම පහසුකම් සවි කිරීම සඳහා ක්‍රියා කරන ලෙස ඉල්ලා ඇත.

(ඊ) සෙන්ට් ඇන්තනීස් ඉන්ඩස්ට්‍රීස්

අවශ්‍ය ප්‍රතිකර්ම පහසුකම් සවි කිරීම සඳහා ක්‍රියා කරන ලෙස ඉල්ලා ඇත.

(උ) සීමාසහිත ලන්කෙම් සිලෝන්

අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රමයක් සවි කිරීම.

1992 නොවැම්බර් වනවිට නිම කෙරෙනු ඇත.

(ඌ) කැලණිතිස්ස විදුලි බලාගාරය

අවශ්‍ය ප්‍රතිකර්ම විධි 1993 ඔක්තෝබර් වන විට සවි කෙරෙනු ඇත.

13. <u>කාර්මික දූෂණයට අදාළ ක්ෂේත්‍රයෙහි මධ්‍යම පරිසර අධිකාරියේ හැකියාවන් ශක්තිමත් කිරීම – නෙදර්ලන්ත ආධාර.</u>

13.1 පහත සඳහන් කරුණු පිළිබඳ දැනුවත්කම ඇති කිරීම සඳහා වැඩ මුළුවක් සංවිධානය කරනු ලැබිණ.

(අ) පාරිසරික තත්ත්ව ප්‍රමිතීන් යොදා ගැනීම.

(ආ) නියමිත ප්‍රයෝජන පදනම් කොට ගෙන ජලාශ වර්ග කිරීම.

(ඇ) දූෂණ පාලන මාර්ගෝපදේශ යොදා ගැනීම.

(ඈ) පරිසර ආරක්ෂණ බලපත්‍ර යෝජනා ක්‍රමය තුළින් පාරිසරික තත්ත්ව ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.

13.2 <u>දූෂණ පාලන මාර්ගෝපදේශ.</u>

පහත සඳහන් කර්මාන්ත සඳහා දූෂණ පාලන මාර්ගෝපදේශ පිළියෙල කරනු ලැබ ඇත.

(අ) ස්වභාවික රබර් කර්මාන්තය

(ආ) සංකේන්ද්‍රිත රබර් කිරි කර්මාන්තය.

(ඇ) කපාපු පොල් කර්මාන්තය.

(ඈ) සම් කර්මාන්තය

(ඉ) කිරිපට්ටි කර්මාන්තය

(ඊ) රෙදිපිළි සැකසුම් කර්මාන්තය

(උ) පළිබෝධ නාශක සැකසුම් කර්මාන්තය

(ඌ) ලෝහ නිමයම් කර්මාන්තය

13.3 **දූෂණ පාලනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය.**

(අ ) රෙදිපිළි කර්මාන්ත පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය නිම කරන ලදි.

(ආ) කපාපු පොල් කර්මාන්තය පිළිබඳ ශක්‍යතා අධ්‍යයන තෙවුම්පතක් පිළියෙල කරනු ලැබ ඇත.

14. **පාරිසරික ආරක්ෂණ බලපත්‍ර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.**

| | |
|---|---|
| බලපත්‍ර සඳහා පරීක්ෂණ | - 698 |
| නව කාර්මික බිම් සඳහා පරීක්ෂණ | - 299 |
| පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ | - 262 |
| නිකුත් කැරුණු බලපත්‍ර සංඛ්‍යාව | - 490 |

15. **පහත සඳහන් කමිටුවලට සහභාගිවීම.**

(අ ) මහ කොළඹ ඇල මාර්ග සහ කණු පද්ධති ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය.

(ආ) මහ කොළඹ අප ජලය සහ සනීපාරක්ෂක මහ සැලැස්ම

(ඇ) කොග්ගල මුහුදේ මෝය කට විමර්ශනය

(ඈ) සංචාරක මහ සැලැස්ම

(ඉ ) රථවාහන ගමනාගමන පනත සංශෝධනය කිරීම

(ඊ ) පොහොර උපදේශක කමිටුව

(උ ) කොළඹ කටුනායක සීඝ්‍රගාමී මාර්ග ව්‍යාපෘතිය

(ඌ) කාර්මිකරණ කොමිෂන් සභාවේ පරිසර කමිටුව

(එ ) හික්කඩුව මුහුදු සනීපාරක්ෂක ව්‍යාපෘතිය

(ඒ ) කොළඹ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව

(ඔ ) මෝදරවිල කර්මාන්ත වත්ත- පානදුර.

16. **ප්‍රාදේශීය බල මණ්ඩලයට බලය පැවරීම.**

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රාදේශීය බල මණ්ඩල නිලධාරීන් පුහුණු කිරීම සඳහා හඳුනාගනු ලැබූ අභ්‍යාසලාභීන් පුහුණු කිරීම සඳහා පුහුණු කිරීමේ වැඩ සටහනක් පිළියෙල කරනු ලැබ ඇත. දූෂණය අඩු කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ජාතික පාරිසරික පනත යටතේ ප්‍රාදේශීය බල මණ්ඩලවලට බලය දෙනු ලබනවා ඇත.

මේ කාර්යය සඳහා අත් පොතක් සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා

## ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය

ස්වභාවික සම්පත් කළමනාකරණ අංශයේ අරමුණු සහ පරමාර්ථ මෙසේය.

(1) ස්වභාවික පරිසර පද්ධතීන් සහ ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සහ එකී සම්පත් විමර්ශනශීලීවත් අරපිරිමැස්මෙන් යුතුව සහ ඥානවන්ත ලෙසත් භාවිතයට ගනු ලබන බවට සහතික වීම.

(2) ජාතික පාරිසරික පනතේ IV සී කොටසේ දක්වා ඇති විධිවිධාන ක්‍රියාවට නංවමින් සංවර්ධන කටයුතුවල පාරිසරික ප්‍රතිවිපාක පූර්වකථනය කිරීමේ හා ප්‍රතිවිපාක අඩු ක්‍රියාමාර්ග හඳුනා ගැනීමේ ක්‍රමයත් තුළින් සංවර්ධනය පරිසරයට හානිකර නොවන බවට සහතික වීම.

### ඒකාබද්ධ සැලැස්ම සම්පාදනය කිරීම:

ස්වභාවික සම්පත් කළමනාකරණ අංශයේ කාර්යයන්ගේ ඉහත කී පරමාර්ථ ඉටුවන බවට සහතික වනු වස් 1992-1996 දක්වා වර්ෂ සඳහා ඒකාබද්ධ සැලැස්මක් පිළියෙල කරන ලදි. මෙකී සැලැස්ම පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින් අනුමත කොට පිළිගන්නා ලදි. මෙය මධ්‍යම පරිසර අධිකාරියේ මුල්ම ඒකාබද්ධ සැලැස්ම විය.

### ජාතික සංරක්ෂණ ක්‍රමෝපාය:

ජාතික සංවර්ධන ක්‍රමෝපායයේ දෙමළ සහ සිංහල පරිවර්තන රජයේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරනු ලැබීමේදී එය මේ අංශය විසින් මැනවින් අධීක්ෂණය කරනු ලැබිණ. මේ ලේඛන 1992 අවසාන වනවිට එළි දකිනු ඇතැයි අපේක්ෂා කැරේ.

### දිස්ත්‍රික් පාරිසරික අංශ දර්ශනය (තොරාඩ් අරමුදල් සහිත)

දිස්ත්‍රික්කයේ වර්තමාන තත්ත්වය, එහි ඇති ජීවී හා අජීවී සම්පත්, ඒවා ප්‍රවර්ධනීය අයුරින් භාවිතයට ගැනීම ඒවායේ ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා දැනට දිස්ත්‍රික්කය සතු හැකියාව යන මේවා පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් හා විශ්ලේෂණයක් ලෙස දිස්ත්‍රික් පාරිසරික අංශදර්ශනය සැලකේ. තවද, දිස්ත්‍රික්කයේ සියලු සංවර්ධන කටයුතු තුළට පාරිසරික අවධානයන් ඇතුළත් කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා සැලසුම් සම්පාදකයන්ට හැකි වනු ඇත්තේ ඉහතකී අංශදර්ශනය නමැති මෙවලම මගිනැයි ද අදහස් කරනු ලැබේ. දිස්ත්‍රික් පාරිසරික ක්‍රියාත්මක සැලසුම් සම්පාදනය පසුව සිදු කරනු ලබනවා ඇත.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, අංශදර්ශක පිළියෙල කරන උපදේශකයන්ට තම කාර්ය භාරය පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි, අංශදර්ශක පිළියෙල කිරීම සඳහා වූ විෂය නිර්දේශය සංශෝධනය කොට දක්වන ලදී.

(අ) පහත සඳහන් දිස්ත්‍රික් පාරිසරික අංශදර්ශක මධ්‍යම පරිසර අධිකාරිය විසින් නම් කරන ලද උපදේශක මණ්ඩලයක් විසින් අනුයුම් කරන ලද අතර, මුද්‍රණය කිරීමේ කාර්ය පරිපාටි ආරම්භ කරන ලදී.
බදුල්ල, කළුතර, හම්බන්තොට.

(ආ) 1990-91 දී පිළියෙල කරන ලද පහත සඳහන් දිස්ත්‍රික් පාරිසරික අංශදර්ශක කෙටුම්පත් ලැබී ඇති අතර ඒවා අගයන ලදී. ඒවායේ අවසාන කෙටුම්පත් ලැබෙන්නට තිබේ.
පොළොන්නරුව, රත්නපුර, කෑගල්ල, මඩකලපුව, අනුරාධපුර, මාතර, මොණරාගල, කුරුණෑගල සහ මාතලේ.
මුද්‍රණ කාර්ය පරිපාටි ළඟදීම ආරම්භ කෙරෙනු ඇත.

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් පාරිසරික අංශදර්ශකය භාර දී ඇති අතර, දැනට එය පිළියෙල කරගෙන යනු ලැබේ.

(ඈ) කොළඹ, ගාල්ල, මහනුවර සහ නුවරඑළිය සඳහා දිස්ත්‍රික් පාරිසරික අංශදර්ශක පිළියෙල කිරීම සම්බන්ධයෙන්, උපදේශකයන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී. කොන්ත්‍රාත් භාරදීමට කටයුතු පිළියෙල කරන ලදී.

මෙය තොරාඩි ආධාර වැඩ සටහන යටතේ සිදු වෙමින් පවත්නා කාර්යයකි.

අංශයේ කටයුතු දිගටම, ස්වභාවික සම්පත් හා පාරිසරික බලපෑම් තක්සේරු කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරමින් කරගෙන යන ලදී.

<u>ස්වභාවික සම්පත් කළමනාකරණය:</u>

(1) <u>වැලි ගොඩලෑම:</u>

බස්නාහිර පළාත ඇතුළත ගංගා පද්ධතියේ අධික ලෙස වැලි හෑරීම පාලනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ මේ අංශය විසින් නිකුත් කරන ලදී. කැළණි ගඟ සහ මහ ඔය මේ වැඩ පිළිවෙලට ඇතුළත් විය.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිතුළු කරන ලද මාර්ගෝපදේශ ක්‍රියාවේ යෙදීම තක්සේරු කිරීම සඳහා කැළණි ගඟ සහ මහ ඔය දිගේ පරීක්ෂණ පවත්වන ලදි. මෙකී මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උප දිසාපතිවරුන් සමග සාකච්ඡා පවත්වන ලදි. දංකොටුව උප දිසාපති කොට්ඨාශය තුළ මහ ඔයේ යන්ත්‍රානුසාරයෙන් වැලි ගොඩ දැම නතර කරන ලදි. අධික ලෙස වැලි හැරීම කරනු ලබන ගිං ගඟට ද මෙකී මාර්ගෝපදේශ අදාළ කරන ලදි.

මේ මාර්ගෝපදේශ බස්නාහිර පළාත් සභාවේ ව්‍යවස්ථාවලට ඇතුළත් කිරීම සඳහා බස්නාහිර පළාත් සභාව ක්‍රියාරම්භ කොට ඇත.

11. <u>ජාතික වැලි අධ්‍යයනය (නෙදර්ලන්ත රජයේ සහයෝගය සහිතව)</u>

මේ අධ්‍යයනය 1991 වර්ෂයේ අවසාන භාගයේදී ආරම්භ වූ අතර, එහි පළමු අදියර 1992 මාර්තු මාසයේදී නිම කරන ලදි. දෙවැනි අදියර 1993 වසරේ මුල් භාගයේදී ආරම්භ කිරීමට නියමිත ය. පළමු අදියරේ අධ්‍යයන වාර්තාව ශ්‍රී ලංකා රජය විසින් පිළිගන්නා ලදි. බස්නාහිර පළාතේ කැළණි ගඟෙන්, කළු ගඟෙන් සහ මහ ඔයෙන් වැලි ලබාගැනීම පිළිබඳ වර්තමාන තත්ත්වය ගැන තක්සේරුවක් පළමු අදියරට ඇතුළත් විය. දෙවැනි අදියර සඳහා වූ විෂය නිර්දේශය පිළියෙල කරන ලද අතර, එය ජාතික වැලි අධ්‍යයන කමිටුව විසින් පිළිගනු ලැබ අරමුදල් ලබාගැනීම සඳහා නෙදර්ලන්ත රජයට ඉදිරිපත් කරන ලදි. දෙවැනි අදියරේ මූලික පරමාර්ථවලින් එකක් වනුයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැලි වෙනුවට යොදා ගතහැකි වෙනත් විකල්ප ප්‍රභවයන් ගැන අධ්‍යයනය කිරීමයි.

111. <u>ජාතික තෙත්බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය:</u>

මේ ව්‍යාපෘතිය 1991 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර, මේ අංශය විසින් කළමනාකරණය කරනු ලැබේ. තාක්ෂණික සහ මූල්‍ය ආධාර නෙදර්ලන්තය විසින් සපයනු ලබන අතර සාමාන්‍ය අධීක්ෂණය ජාතික තෙත්බිම් මෙහෙයුම් කමිටුව විසින් සිදු කෙරේ. තෙත්බිම් පිළිබඳ පාදක දත්ත යාවත්කාල කිරීම හා සම්පූර්ණ කිරීමත්, සංරක්ෂණය හා කළමනාකරණය සඳහා තෙත්බිම් ප්‍රමුඛතාගත කිරීමත්, තෝරා ගන්නා ලද තෙත්බිම් පෙදෙස් සඳහා සංරක්ෂණ කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමත් එකී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීමත් ව්‍යාපෘතියේ කටයුතුවලට ඇතුළත් වේ. පළමු අදියර 1992 නොවැම්බර් මාසයේදී නිම කැරෙනු ඇති අතර, දෙවැනි අදියර ඉන්පසුව නිම

පහත සඳහන් වැඩ බිම් වාර්තා සහ සංරක්ෂණ කළමනාකරණ සැලසුම් පිළියෙල කරනු ලැබ ඇත.

වීරවිල වැව, තිස්ස වැව, දෙබර වැව, යෝධ වැව

තොග්ගල ජලාශය

සේනානායක සමුද්‍රය

තම්බෝව වැව

හෝර්ටන් තැන්න දියපාරවල්

මදුරුඔය ජාතික උද්‍යානය

මුන්දලම වැව

පලටුපාන මහ ලේවාය

මහවැලි ගඟ ගංවතුර පෙදෙස්, හඳපාන, බෙන්ඩිය විල්ලු

මහ තරගං ලේවාය

බුන්දල අභය භූමිය

මින්නේරිය වැව

බෙල්ලන්විල, අත්තිඩිය

තාක්ෂණික වාර්තා තුනක් ද නිම කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

## තණිම් සහ ඉඩම් ගොඩ කිරීම් කටයුතු පිළිබඳ උපදේශමාලා:

මේ අංශය විසින් පිළියෙල කරන ලද තණිම් සහ ඉඩම් ගොඩ කිරීම් පිළිබඳ මාර්ගෝපදේශ කෙටුම්පත අදාළ නියෝජ්‍යායතන සහභාගි වූ රැස්වීම්වලදී සාකච්ඡාවට ගැනිනි. තණිම් හා ඉඩම් ගොඩ කිරීම් කටයුතුවලදී අනුගමනය කළයුතු තාක්ෂණික හා පරිපාලනමය කාර්ය පරිපාටි මෙකී මාර්ගෝපදේශවලට ඇතුළත් වේ. මෙකී කටයුතු පාලනය කිරිමෙහිලා මඟ පෙන්වීම සඳහා මෙකී මාර්ගෝපදේශ දැන් ප්‍රාදේශීය බලමණ්ඩල වෙත නිකුත් කරනු ලැබ ඇත.

## වග විභාගයකින් තොරව තුඹුරු ගොඩ කිරීම:

බස්නාහිර පළාතේ පහසුවෙන් හානියට පත්විය හැකි ප්‍රදේශ පෞද්ගලික සංවර්ධකයන් විසින් වගවිභාගයෙන් තොරව ගොඩ කරනු ලැබීම වැළැක්වීමේ අරමුණින් යුතුව එබඳු පෙදෙස් හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ හා ප්‍රාදේශීය සභා සමග ඒකාබද්ධව ක්‍රියා කරන ලදි.

පස් සංරක්‍ෂණ පනත නැවත කෙටුම්පත් කිරීම:

1956 පස් සංරක්‍ෂණ පනතේ සංශෝධනයට භාජනය වියයුතු තැන් මෙකී අංශය විසින් ජාතික පාරිසරික මෙහෙයුම් කමිටුවේ නියමය පරිදි හඳුනාගන්නා ලදී. රැස්වීම් කීපයක් ම කැඳවන ලද අතර අදාළ නියෝජ්‍යායතන සමග සාකච්ඡා පවත්වන ලදී. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම ඇතිව, නැවත කෙටුම්පත් කළයුතු වන තැන් ඇතුළත් කරමින් අමාත්‍ය මණ්ඩල සන්දේශ කෙටුම්පතක් පිළියෙල කරන ලදුව එය ජාතික පාරිසරික මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කරන ලදී. කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ගරු ඇමතිතුමා විසින් එකී සන්දේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කැරිණ.

කළුගල් අපනයනය කිරීම:

කළුගල් කැඩීම හා පිටරට යැවීම පිළිබඳව භූවිද්‍යා සමීක්‍ෂණ දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා පවත්වන ලදී. කළුගල් කඩාගැනීම පිළිබඳ පාරිසරික මාර්ගෝපදේශ පිළියෙල කරගෙන යනු ලබන අතර ප්‍රාදේශීය බල මණ්ඩලවල භාවිතය සඳහා ඒවා නිකුත් කරනු ලබනවා ඇත.

මැණික් ගැරීම:

මැණික් ගැරීමේ කටයුතු හේතුකොට ගෙන උද්ගත වන පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් රාජ්‍ය මැණික් සංස්ථාව සමග මධ්‍යම පරිසර අධිකාරිය සාකච්ඡා රැසක් පවත්වා ඇත. ප්‍රතිවරුද්ධ පාරිසරික බලපෑම් පාලනය කිරීම් වස් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පාරිසරික ආරක්‍ෂාවන් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. ගංගා පතුල් සහ ජල මාර්ග වෙන්දේසි කිරීම ද මධ්‍යම පරිසර අධිකාරියේ අවධානයට ලක් කරන ලද අතර, වඩා යහපත් පාරිසරික කළමනාකරණයක් ඇති කිරීම උදෙසා රත්නපුර, මොණරාගල, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කවල ගං පතුල් කැණීම් පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

අධ්‍යයනය කරන ලද ගංගා පද්ධතීන් නම් අඹන් ගග, සීතාවක ගග, කොස්වතුඔය, හල් ආර, මහදොළ, කිරිඇළි ගග, ගැටහැතිඔය, පොතුපිටිය ගග, උඩගමදොළ සහ බගවන්තලා ඔය යන මේවා ය.

## වනාන්තර අංශයේ පර්යේෂණ කමිටුව:

කැලෑ දෙපාර්තමේන්තුවේදී රැස්වීම් පවත්වන ලදී. පහත සඳහන් පර්යේෂණ යෝජනා සාකච්ඡා කොට අනුමත කරන ලදී.

1. කතල්ස් තලාපයේ සත්ව සමීක්ෂණය
2. නැගෙනහිර සිංහරාජ වනයේ තෝරාගත් ප්‍රදේශයන්හි ශාක පිළිබඳ ලේඛනයන්.
3. කතල්ස් පෙදෙසේ වනවෘක්ෂ ලේඛනයන් සහ ශාක සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයන්.
4. ශ්‍රී ලංකාවේ පහත් බිම් වැසි වනාන්තරවල ජීවී විශේෂයන්ගේ සංයුතිය කෙරෙහි, තෝරාගත් ගස් කැපීමේ ප්‍රතිවිපාක.

## හදිසි අවස්ථා කැලෑ රෙගුලාසි:

අනුපිළිවෙලින් කැලෑ ආඥාපනත සහ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥාපනත ද යටතේ වන රක්ෂිත වන සහ වනසත්ව අභයභූමි ආනෘතිගත හදිසි කැලෑ රෙගුලාසි යටතේ නැවත ගැසට් කරන ලදී. අධීක්ෂණ කටයුතු කැලෑ දෙපාර්තමේන්තුවත් මධ්‍යම පරිසර අධිකාරියේ නීති නිලධාරියාත් අතර සම්බන්ධීකරණය කැරිණි. ඒ ඒ දිස්ත්‍රික්කවල දිසාපතිගේ සහාය ඇතිව, මෙකී රෙගුලාසි යටතේ ගැසට් කළහැකි වූ යෝජිත වන රක්ෂිතයන්ගේ බෙදීම් සහ මායිම් හඳුනා ගැනීම සඳහා ද ක්‍රියා කරන ලදී.

## තොරාඩ් අරමුදල් ලබන ව්‍යාපෘති:

1. <u>ආදයානවත්ත-කඹුරුපිටිය.</u>

කැලෑ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කැරුණු මෙකී නැවත වන වගා කිරීමේ ව්‍යාපෘතිය මේ අංශය විසින් අධීක්ෂණය කරන ලදී.

11. <u>ඇට්ටිපොලකන්ද.. සහ රාජම්මන/මාතලේ.</u>

කැලෑ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කැරුණු මෙකී නැවත වන වගා කිරීමේ ව්‍යාපෘතිය මේ අංශය විසින් අධීක්ෂණය කරන ලදී.

111. <u>රුක්රෝපණය.</u>

රුක්රෝපණය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් මුද්‍රණය කරන ලද අතර, දිස්ත්‍රික්ක තුල බීජ පැළ බැංකුවක් ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු යොදන ලදී.

1V. හන්තාන කන්දේ ඉදිකිරීම් කටයුතු.

හන්තානේ ඇන්ටනා කුලුණු ඉදිකිරීම සඳහා ලංකා විදුලිය බල මණ්ඩලය, ටෙලිකොම්, ටෙලිශාන් සහ සෙල්ටෙල් යන ආයතනවලින් අංශය වෙත ඉල්ලුම්පත් ලැබුණි. පරීක්ෂණ පවත්වා යෝජිත සංවර්ධන කටයුතු පිළිබඳ නිර්දේශ ප්‍රදේශයේ, ප්‍රාදේශීය බල මණ්ඩලය වෙත යවන ලදි. කන්ද කරා ඉදිකිරීමට යෝජිත මාර්ගය පිළිබඳ සවිස්තර අධ්‍යයනයන් කරන ලදි. පාරිසරික අධ්‍යයනයන් දැන් කරගෙන යනු ලැබේ.

V. ජලජීවී ව්‍යාපෘති.

ජලජීවීන් ඇති කිරීමේ ව්‍යාපෘති අනුමත කිරීම සඳහා වයඹ පළාත් සභාව විසින් කැඳවන ලද ජලජීවීන් ඇති කිරීමේ විෂය සීමා කමිටු රැස්වීම්වලට මධ්‍යම පරිසර අධිකාරිය නොකඩවාම සහභාගි විය.
ව්‍යාපෘති සංවර්ධනයෙහිලා පාරිසරික කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කෙරෙන බවට සහතික වනු වස් ජලජීවී සංවර්ධනයන් සඳහා පාරිසරික මාර්ගෝපදේශ පිළියෙල කරන ලදි.

මධ්‍යම පරිසර අධිකාරිය කිතුත් කරන ලද මාර්ගෝපදේශ ක්‍රියාවේ යොදනු ලැබේදැයි අගැයුම් කරනු සඳහා පවත්නා ව්‍යාපෘති අධීක්ෂණය කිරීම ද ආරම්භ කරන ලදි.

සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළදී පුත්තලම් දිස්ත්‍රික්කයේ කණිස්සන් ඇති කිරීමේ ව්‍යාපෘති පිහිටුවීම සඳහා ඉල්ලුම්පත් තිස්තුනක්(33) ක් ලැබිණි. කොන්දේසිවලට යටත්ව පාරිසරික අවසරය එයින් ව්‍යාපෘති දහතුනකට(13)දී ඇත. ව්‍යාපෘති අටක්(08) පාරිසරික හේතූන් මත විෂය සීමා කමිටුව විසින් ප්‍රතික්ෂේප කැරිණි. ව්‍යාපෘති දොළහක් (12) දැනට කරගෙන යනු ලැබේ.

මුන්දලම වැව් පද්ධතිය සඳහා සංරක්ෂණ කළමනාකරණ සැලැස්ම.

දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබන පහත්බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් මුන්දලම වැව් පද්ධතිය සඳහා වැඩබිම් වාර්තාවක් සහ සංරක්ෂණ කළමනාකරණ සැලැස්මක් සම්පාදනය කරගෙන යනු ලැබේ. ඒ අනුව, සැලැස්ම නිම තොට නිශ්චිත කළමනාකරණ තීරණවලට එළඹෙනතුරු එකී ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සීමා කිරීමට තීරණය කරන ලදි.

නායයාම් පිළිබඳ ජාතික ව්‍යසන පරිපාදිතා හා දුර්විපාක අඩු කිරීමේ සැලැස්ම.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් කැඳවන ලද තාක්ෂණික උපදේශක කණ්ඩායමේ ඒ, බී සහ සී කමිටුවල මේ අංශය නියෝජනය විය.

මුතුරාජවෙල සැලැස්මේ මෙහෙයුම් කමිටුව.

ඉහත කී කමිටුවේ රැස්වීම්වලට මේ අංශය සහභාගි විය. සංවර්ධන ව්‍යාපෘති තුළට ඇතුළත් පාරිසරික අංග නිර්දේශ කරන ලදි. කෙරවළපිටිය සංවර්ධනය කිරීම සඳහා කුඩා පරිමාණ ගොඩ කිරීම් ගැන දැනට අධ්‍යයනය කරගෙන යනු ලැබේ.

පාරිසරික බලපෑම් තක්සේරුව.

මේ වැඩ සටහනේ අරමුණ වනුයේ ජාතික පාරිසරික පනතේ 1V සී වගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාවට නංවමින් සංවර්ධන කටයුතුවල පාරිසරික ප්‍රතිවිපාක කල්ඇතිව ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් ද ප්‍රතිවිපාක අඩු කිරීමේ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම ද තුළින් පාරිසරික වශයෙන් අහිතකර නොවන සංවර්ධනයක් සහතික කිරීමයි.

පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංවිධානමය සැකැස්ම.

පාරිසරික බලපෑම් තක්සේරුවේ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදේශය තුළ ශක්තිමත් උප ඒකකයක් ගොඩ නැගීමට ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විසින් අතිරේක කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යා අනුමත කරන ලදි. ඊට අමතරව, නියමිත ව්‍යාපෘති අනුමත කිරීම පිළිබඳ වග කිවයුතු රජයේ ප්‍රධාන නියෝජ්‍යායතන එකිනෙකෙහි ශක්තිමත් පාරිසරික බලපෑම් තක්සේරු මැදිරි පිහිටුවීම සඳහා කාර්ය මණ්ඩලය යොදවන ලදි. තවද, ව්‍යාපෘති අගැයුම සඳහා අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සාදාගත හැකි වනසේ විශේෂඥ මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද කටයුතු යොදන ලදි.

පාරිසරික තක්සේරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ කාර්යක්‍රමය.

ජාතික පාරිසරික පනතේ 1V සී කොටසේ විධිවිධාන යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට අවශ්‍ය කෙරෙන, නියමිත ව්‍යාපෘති, ව්‍යාපෘති අනුමත කරන ආයතන, පාරිසරික බලපෑම් තක්සේරු කාර්ය පටිපාටි හා ක්‍රම නියම කොට දැක්වෙන මාර්ගෝපදේශ යනාදී තොරතුරු නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලදි.

පහත දැක්වෙන මාර්ගෝපදේශ පිළියෙල කරන ලදි.

1. උචිත ව්‍යාපෘති අනුමත කරන ආයතන තීරණය කිරීමේ උපමානයන්

11. මූලික ව්‍යාපෘති තොරතුරු ඉදිරිපත් කිරීම

iii. පාරිසරික විෂය සීමාවන් මෙහෙයවීම

IV. මූලික පාරිසරික පරීක්ෂණ/පාරිසරික බලපෑම් තක්සේරු සඳහා විෂය නිර්දේශ සැකසීම.

ව්‍යාපෘති අනුමත කරන ආයතන මගින් පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලිය කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කෙරෙන බවට වග බලා ගනු වස්, පාරිසරික ප්‍රතිපත්ති ( NAREPP ) ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාව තුළ ප්‍රයෝජනයට ගනු ලැබීම සඳහා ලෝක බැංකු අංශීය මාර්ගෝපදේශ උචිත පරිදි සකසා ගැනීමේ හැකියාව පරීක්ෂා කරගෙන යනු ලැබේ.

මූලික පාරිසරික පරීක්ෂණ/පාරිසරික බලපෑම් තක්සේරු පිළියෙල කිරීමේ/අගැයීමේ නිරත රාජ්‍ය හා පෞද්ගලික අංශවල ප්‍රයෝජනය සඳහා අත්පොතක් සම්පාදනය කිරීම පිණිස කටයුතු ආරම්භ කොට ඇත.

බලපෑම් පිළිබඳ අනාවැකි හා තක්සේරුව සඳහා ගණිතමය/පරිගණක ආදර්ශ සංවර්ධනය කළ හැකි ඒකකයක් පිහිටුවීමට මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා පවත්වා ඇත.

<u>පාරිසරික බලපෑම් තක්සේරු පිළිබඳ පුහුණුව.</u>

මධ්‍යම පරිසර අධිකාරියේ හා වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා, සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළදී කෙටි කාලීන සහ දීර්ඝකාලීන පුහුණු වැඩ සටහන් රැසක්ම පවත්වන ලදි. පාරිසරික බලපෑම් තක්සේරු පිළිබඳ සියුම් පාඨමාලාවන් නිම කරනු ලැබූ අතර, මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 15 දෙනෙක් පාරිසරික බලපෑම් තක්සේරු පිළිබඳ සියුම් පුහුණුවක් ලැබූහ.

ස්වභාවික සම්පත් සහ පාරිසරික ප්‍රතිපත්ති ව්‍යාපෘතියේ ( NAREPP ) සහාය ඇතිව පාරිසරික බලපෑම් තක්සේරු පුහුණු වැඩ සටහන ක්‍රියාත්මක වෙමින් පවතී.

<u>පාරිසරික බලපෑම් තක්සේරුව.</u>

1. කිරින්ද ධීවර වරාය ප්‍රතිසංස්කරණය කිරීම.

   කිරින්ද ධීවර වරාය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරන ලද්දේ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය විසිනි. අවසාන පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව දැන් ලැබී ඇති අතර, එය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් මධ්‍යම පරිසර අධිකාරියත් විසින් අගැයුම් කරනු ලබමින් පවතී.

2. කොග්ගල අපවාහ ප්‍රතිකර්ම කර්මාන්ත කෙරෙන් නිකුත් වන කාර්මික අපවාහයන් අපහරණය කිරීම සඳහා යෝජිත මුහුදු මෝයකට.

අධ්‍යයනය සඳහා විෂය නිර්දේශය සකස් කරන ලදුව පාරිසරික බලපෑම් තක්සේරුව සිදු කිරීම සඳහා මහතො ළඹ ආර්ථික කොමිසම වෙත යවන ලදි.

3. කළු ගඟ ජලාශය හා කෘෂිකර්ම ව්‍යාප්ති ව්‍යාපෘතිය.

මේ ව්‍යාපෘතිය යෝජනා කරන ලද්දේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසිනි. ඇටඹ ගහ ඇලි සහ කිතවැටුව ඔය ඔතකු වන ස්ථානයට මදක් පහළින් කළුගඟ හරහා වේල්ලක් ඉදි කිරීමට යෝජනා කරනු ලැබ ඇත. මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාළ කොන්දේසි පිළිගෙල කරනු ලැබ ඇති අතර තවදුර කටයුතු සඳහා ඉඩම් වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය වෙත භාර දෙන ලදි.

4. මැණික් ගඟ හැරවීමේ ව්‍යාපෘතිය.

කිරිඳි ඔය අසබඩ ඉවුරේ දැනට තිබෙන ලුණුගම් වෙහෙර ජලාශයට මැණික් ගඟේ ඉහළ මධ්‍යම ප්‍රදේශවල සිට ජලය හැරවීමට මේ ව්‍යාපෘතියෙන් අදහස් කෙරේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අංග නම් ගඟ හරස් කරන වේල්ල සහ යෝජිත ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය හරහා කි.මී. 18 ක පරිවහන ඇල යන මේවා ය. පාරිසරික බලපෑම් තක්සේරුව නිම වී ඇති අතර සංවර්ධකයා, පොදු පරීක්ෂණයට පෙර තවදුර පරිපූරක වාර්තාවක් පිළියෙල කිරීමෙහි යෙදී සිටී.

5. වළවේ වාරිමාර්ග සංවර්ධන සහ ව්‍යාප්ති ව්‍යාපෘතිය (උතුරු ඉවුර)

වළවේ ව්‍යාපෘතියේ උතුරු ඉවුර ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දැන් කරගෙන යනු ලැ බේ. ශක්‍යතා අධ්‍යයනය සමග පාරිසරික බලපෑම් තක්සේරුවක්ද පිළියෙල කොට සංවර්ධකයාට යවා ඇත. පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනය සාර්ථකව කරගෙන යනු ලැබේ.

6. කණ්ඩලම හෝටල් ව්‍යාපෘතිය.

සීමාසහිත ඒට්කන් ස්පෙන්ස් හෝටල් කළමනාකරණ (පෞද්ගලික) සමාගම සහ කනපිසන්ස් ඩී ලංකා සමාගම ද විසින් ඉදිරිපත් කරන ලද පාරිසරික වාර්තා අගැයුම් කොට ව්‍යාපෘති දෙක සඳහා කොන්දේසි සහිත අනුමතය දෙන ලදි.

7. <u>මහබෙරියතැන්න ගොල්ෆ් සහ හෝටල් ව්‍යාපෘතිය.</u>

වික්ටෝරියා ජලාශයට ආසන්න මහබෙරියතැන්නේ කාමර 250 කින් යුත් තරු පහේ පස්මහල් හෝටලයක් ද නිවහන 500 ක් ද ගොල්ෆ් පිටියක් ද ඉදි කිරීමට සීමාසහිත රජවැල්ල හෝල්ඩිංස් (පෞද්ගලික) සමාගම යෝජනා කොට ඇත. අවශ්‍ය පාරිසරික බලපෑම් තක්සේරුව සඳහා අදාළ කොන්දේසිමාලාව දැනට සකස් කරගෙන යනු ලැබේ.

8. <u>ඉහළ කොත්මලේ ජලවිදුලි බල ව්‍යාපෘතිය.</u>

ව්‍යාපෘතියට අයත් වෙන ප්‍රදේශය ශ්‍රී ලංකාවේ දකුණු මධ්‍යම කොටස තුළ පිහිටා ඇති අතර කොත්මලේ ඔය ජලාධාර ප්‍රදේශය අයත් වේ. මේ ව්‍යාපෘතියේ ප්‍රධාන අංග ලක්ෂණ වනුයේ තැලිඩෝනියා වේල්ල, තැලිඩෝනියා ප්‍රධාන දිය උමග, තැලිඩෝනියා බලාගාරය, තලවාකැලේ ආදානවේල්ල, තලවාකැලේ ප්‍රධාන දිය උමග, තලවාකැලේ බලාගාරය යන මේවා ය.
තැලිඩෝනියා ස්ථාපිත ධාරිතාව මෙගවොට් 50 ක් වන අතර, තලවාකැලේ මෙගෝ වොට් 180 කි. අදාළ කොන්දේසිමාලාව සකස් කොට මධ්‍යම පරිසර අධිකාරිය වෙත යවා ඇත.

9. <u>කුකුළු ගඟ ජල විදුලිය ව්‍යාපෘතිය.</u>

කුකුළු ගඟ ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ තලවානේය. මුල් අවධිය තුළදී, ව්‍යාපෘති විකල්පයන් අගැයීම සඳහා සංකල්පීය සැලසුම් වාර්තාවන් පිළියෙල කරනු ලැබීන. මේ වාර්තාව අගැයීමෙන් පසු ගංගා විකල්පයේ කුකුලේ ගමන් මාර්ගය තෝරාගනු ලැබ ඇත. මේ තෝරාගැනීම සම්බන්ධයෙන් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කොට ඇති අතර, එය අගයනු ලබමින් පවති.

10. <u>සපුගස්කන්ද බලාගාර ව්‍යාප්ති ව්‍යාපෘතිය.</u>

නව බලාගාරයෙන් මෙගෝ වොට් 40 ක පමණ විදුලිය බලයක් සැපයෙනු ඇත. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ ප්‍රමාණවත් භාවය පිළිබඳව එය අගයනු ලැබූ අතර, වාර්තාවේ ප්‍රවර්ධනය කළයුතු තැන් පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියට දන්වා ඇත.

11. <u>තොළඹ-කටුනායක පිසුගාමී මාර්ග ව්‍යාපෘතිය.</u>

තොළඹ-කටුනායක පිසුගාමී මාර්ගයෙන් තොළඹ නගරයේ සිට කටුනායක ගුවන් තොටුපළ දක්වා කි.මී. 30 ක අධිවේග මාර්ග සම්බන්ධතාවක් සැලසෙනු ඇත. පාරිසරික බලපෑම් තක්සේරු ලැබී ඇති අතර, මූලික අගැයුමේදී යම් යම් අඩු-ලුහුඩුකම් පෙන්වා දෙනු ලැබිණ. පොදු පරීක්ෂණයට පෙර සැලකිල්ලට භාජනය කිරීම සඳහා මේවා සංවර්ධකයාට දන්වා යවා ඇත.

12. <u>මහර-කතරගම දුම්රිය මාර්ගය.</u>

මූලික ව්‍යාපෘති තොරතුරු ලැබී ඇත.

13. <u>විකල්ප දකුණු මහා මාර්ගය.</u>

මූලික ව්‍යාපෘති තොරතුරු ලැබී ඇත.

පහත සඳහන් හෝටල් ව්‍යාපෘති පිළිබඳ යෝජනා ලැබී ඇති අතර, ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යනු ලැබේ.

පුබෝපභෝගී නිවස්න පුගලය - බඹරැන්ද, දික්වැල්ල

ගුරුගේ හෝටල් විසින් නිම වෙන මහනුවර තරුපහේ හෝටලය

මීරිගම හෝටලය (කාමර 150)

තැන්දියන් හෝටල් සමාගමෙන් ඉදි වෙන මහනුවර පුබෝපභෝගී හෝටලය.

නුවරඑළිය කාමර 100 හෝටලය- වෝනාපි ඉන්ටර් නැෂනල්

රජවැල්ල හෝල්ඩිංස් - මහනුවර

සිලෝන් ටුවරිස් සමාගම-පල්ලෙකැලේ

මැරිගෝල් ප්‍රොපර්ටි ඩෙවලොප්මන්ට්, නුවරඑළිය

ගුරුගේ හොටෙල්ස්, තෝනාගම

## ප්‍රවර්ධන අංශය

### පාරිසරික අධ්‍යාපනය.

නොරාඩ් ආධාර ලබන ව්‍යාපෘතිවල පාරිසරික අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය සැකෙවින් මෙසේ ය.

**(අ) ප්‍රාථමික අධ්‍යාපනය.**

1992 දී පැවැත්වීමට නියමිත වූ විශේෂඥ ගුරුවරුන් සඳහා වූ වැඩමුළු පහෙන් හතරක් නිම කරන ලදි. මෙකී වැඩ මුළු කුරුණෑගල මහනුවර, ගාල්ල, කොළඹ යන ස්ථානවලදී පවත්වන ලදි.

ප්‍රාථමික පාසල්වල ළමයින්ගේ දෙමව්පියන් සහ ගුරුවරුන් සඳහා පැවැත්වීමට නියමිත සම්මන්ත්‍රණ හයෙන් පහක් පොලොන්නරුව, අනුරාධපුර, කුරුණෑගල, මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවලදී පවත්වන ලදි.

ගුරුවරුන්ගේ මාර්ගෝපදේශ දැනට පිළියෙල කර ගෙන යනු ලැබේ.

**(ආ) ද්විතීයික අධ්‍යාපනය.**

මෙම ව්‍යාපෘතිය යටතේ සහ වෙනත් උපස්තම්භක ද්‍රව්‍ය යටතේ පරිපූරක ගුරු මාර්ගෝපදේශ පිළිබඳ අත්හදා බැලීමේ උගැන්වීම්, දකුණු, මධ්‍යම හා බස්නාහිර පළාත්වල පාසල් 10 කින් තෝරා ගන්නා ලද ගුරුවරුන් සඳහා වූ සම්මන්ත්‍රණයකින් ආරම්භ විය. මෙකී උගැන්වීමේ ආධාරක මේ සම්මන්ත්‍රණයේදී සමාලෝචනය කැරිනි.

උගැන්වීමේ ආධාරක උපකරණ ලෙස පිළියෙල කරන ලද පෝස්ටර් දැන්වීම් දෙකක් මුද්‍රණය සඳහා සූදානම් ව ඇත. තවත් පෝස්ටර් දැන්වීම් තුනක් පිළියෙල කිරීම 1992 ඔක්තෝබර් මස අවසාන වනවිට නිම කෙරෙනු ඇත.

(ඇ) (ඇ) **තාක්ෂණික අධ්‍යාපනය.**

සියලුම අනුබද්ධ විශ්ව විද්‍යාල ආයතනවල දැනටමත් හඳුන්වා දෙනු ලැබ තිබෙන පරිසරය පිළිබඳ ප්‍රධාන පාඨමාලාව සඳහා වූ පාඨමාලා සංයුතිය පාඩම් 30 කින් සමන්විත වේ.

සියලු පාඩම් දැන් කෙටුම්පත් ස්වරූපයෙන් පවත්නා අතර, ඒවා දැන් සංස්කරණය කරගෙන යනු ලැබේ. ඉංග්‍රීසි අනුවාදය 1992 දෙසැම්බර් වනවිට මුද්‍රණය සඳහා සූදානම් වනු ඇත. සිංහල සහ දෙමළ අනුවාද 1993 මාර්තු මාසය වන විට නිම කෙරෙනු ඇත.

රාජ්‍ය නොවන සංවිධාන

රාජ්‍ය නොවන සංවිධාන විසින් භාරගනු ලැබූ ව්‍යාපෘති දාහතරකට නොරාඩ් මුල්‍ය ආධාර (රු. 10,21,000/=) 1991 දී ලැබුණු අතර, ඉන් එකොළහක් 1992 තුළදී ක්‍රියාත්මක වෙමින් පවතී. මෙකී ව්‍යාපෘති ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කරනු ලැබිණ. දැනට පවත්නා තත්ත්වය මෙසේය.

(අ) ජාතිය නගා සිටුවීමේ සංගමය විසින් තාක්ෂණාර්ථික ඉඩම් තාක්ෂණය භාවිතා කෙරෙමින් උඩරට උප දිසාපති කොට්ඨාශ තුනක ක්‍රියාත්මක කෙරෙන පස සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිමවන ලදි.

(ආ) තරුණ සත්වවේදීන්ගේ සංගමය විසින් කිත්මුවා නම් වූ පරිසර සඟරාව පළ කිරීම නිම කරනු ලැබ ඇත.

(ඇ) මුතුරාජවෙල පිළිබඳ වීඩියෝ චිත්‍රපට තුනක් නිෂ්පාදනය කරනු ලැබූ අතර, ශ්‍රී ලංකාවේ වන ජිවීන් හා ස්වභාව ධර්මය සුරැකීමේ සමිතිය විසින් රූපවාහිනිය ඔස්සේ විකාශනය කරන ලදි.

(ඈ) ව්‍යාපෘති හතක් ක්‍රියාත්මක කරගෙන යනු ලබන අතර, 1992 දී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරනු ලැබේ. සමිතිය ක්‍රියා විරහිත වූ බැවින්, නිම කරනු ලැබීමට පෙර එක් ව්‍යාපෘතියක් නතර විය.

නව ව්‍යාපෘති දහයට 1992 දී නොරාඩ් ආයතනයෙන් මුල්‍යාධාර (රු. 5,00,000/=) ලැබුණි. මැලේරියා මර්දනය

පිළිබඳ වූ එක් ව්‍යාපෘතියක් නිම කරන ලද අතර, අනෙක් තවය ක්‍රියාත්මක කිරීමේ කටයුතු කරගෙන යනු ලැබේ.

1992 අගෝස්තු මාසයේදී රාජ්‍ය නොවන සංවිධානවලින් නව ව්‍යාපෘති යෝජනා කැඳවනු ලැබූ අතර, මේ වනවිට යෝජනා 25 ක් ලැබී ඇත.

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළදී රාජ්‍ය නොවන නව පාරිසරික සංවිධාන තිස් එකක් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කැරිණි.

<u>ස්වේච්ඡා පාරිසරික ව්‍යාප්ති නිලධාරීන්:</u>

පාරිසරික ව්‍යාප්ති කටයුතු සඳහා ස්වේච්ඡා සේවකයන්ගේ සේවය ලබා ගැනීමට නව ක්‍රියා මාර්ගයක් දියත් කරන ලදි. දැන්වීම් මගින් ඉල්ලුම්පත් කැඳවනු ලැබූ අතර, ප්‍රතිචාරය දැක්වූ අය අතරින් ස්වේච්ඡා පාරිසරික ව්‍යාප්ති නිලධාරීන් වශයෙන් දිස්ත්‍රික්ක 18 කින් 769 දෙනෙකු තෝරා ගන්නා ලදි.

එක් දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම්කරුවන් තිදෙනෙකු බැගින් මහරගමදී පැවැත් වූ සම්මන්ත්‍රණයකදී පුහුණු කරන ලදි. දිස්ත්‍රික් මට්ටමින් අනෙක් ස්වේච්ඡා නිලධාරීන් පුහුණු කිරීම සඳහා මෙසේ පුහුණුව ලැබූවන් ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා යොදවා ගනු ලැබේ. දිස්ත්‍රික්ක මට්ටමින් ස්වේච්ඡා පාරිසරික ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම පිළිබඳ උපදෙස් නිකුත් කරන ලදි. නොරාඩ් මුදල් ආධාර ඇතිව දිස්ත්‍රික්ක මට්ටමින් සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරන ලදි. මේ වැඩ පිළිවෙල යටතේ මුළු වශයෙන් සම්මන්ත්‍රණ 200 ක් පමණ පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ.

<u>පාසල් සම්මන්ත්‍රණ.</u>

පොලොන්නරුව, ගම්පහ, කොළඹ, බදුල්ල සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල පාසල් සම්මන්ත්‍රණ දහයක් පවත්වන ලදි. මේ වැඩ පිළිවෙල යටතේ නියමිත පාසලක ජ්‍යෙෂ්ඨ සිසුන් සම්මන්ත්‍රණයට සහභාගි වන අතර, අතිරේක වශයෙන් අසළ පාසල්වලින්ද සිසුහු සහභාගි වෙති. එක් එක් සම්මන්ත්‍රණයට සහභාගි වන සංඛ්‍යාව 500 ක් පමණ වන අතර මෙතෙක් පවත්වන ලද සම්මන්ත්‍රණවලට සහභාගිවී ඇති මුළු ගණන 10,000ක් පමණ වේ.

## පාසල් පාරිසරික සමිති.

පාසල් පාරිසරික සමිති පිහිටුවීම ව්‍යාප්ත කිරීමත් එම සමිතිවල ශිෂ්‍ය නායකයින් පුහුණු කිරීමත් සඳහා 1992 තුළදී විශේෂ අවධානයක් යොමු කරන ලදී. මේ තාක් සමිති 450 ක් පිහිටුවනු ලැබ ඇති අතර, තවත් සමිති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත් ලැබෙමින් පවතී. සමිතිවල ශිෂ්‍ය නායකයන් සඳහා සම්මන්ත්‍රණයක් දැනටමත් මාතලේ දිස්ත්‍රික්කයේ පවත්වනු ලැබ ඇත. ළඟදීම අනෙත් දිස්ත්‍රික්කවල ද එවැනි සම්මන්ත්‍රණ පවත්වනු ලබනවා ඇත.

## පාරිසරික පුරෝගාමී බළකාය.

පාරිසරික පුරෝගාමී බළකාය සඳහා වූ ප්‍රතිශෝධිත අත්පොත මුද්‍රණය සඳහා සූදානම් කැරිණ.

පාරිසරික පුරෝගාමී බළකායේ වැඩ සටහනට සහභාගි වූ පාසල් සංඛ්‍යාව වර්ෂය තුළදී 42 සිට 74 දක්වා ඉහළ නැංගේය.

පාසල් 6 ක දිවුරුම්දීමේ උත්සව පැවැත්වුණු අතර, 1993 දී තවත් 2ක් පැවැත්වීමට නියමිතව ඇත.

ජුනිමස 23 වැනි දින බුත්තල ගම්උදාව විවෘත කිරීමේ උත්සවයේ සංදර්ශනයට ද 1992 සැප්තැම්බර් මස 17 වැනි දින විහාර මහාදේවී උද්‍යානයේදී පැවැත්වුණු ජාතික රුක්රෝපණ දින උත්සවයට ද පුරෝගාමී බළකායවල් සහභාගි වූහ.

## ගම්උදාව.

බුත්තලදී පවත්වන ලද 1992 ගම්උදාවට මධ්‍යම පරිසර අධිකාරිය සිරිත් පරිදි සහභාගි විය. අසළ පාසල්වල ළමයින් විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ පාරිසරික ගැටළු පිදහා දැක්වෙන ප්‍රදර්ශන භාණ්ඩ ප්‍රදර්ශන කුටියේදී ඉදිරිපත් කරන ලදී. ප්‍රදර්ශන භාණ්ඩ පිළියෙළ කිරීමේදී හා ඒවා ඉදිරිපත් කිරීමේදී මොණරාගල දිස්ත්‍රික්කයේ දිසා පාරිසරික අනුයෝජිත ආයතනය සහාය විය. දිස්ත්‍රික්කයේ පාරිසරික පුරෝගාමී බළකාය හා එක්ව මධ්‍යම පරිසර අධිකාරිය විසින් තනන ලද ප්‍රදර්ශන රථයක් ගම් උදාව ආරම්භ කෙරෙන දිනයේදී සංදර්ශනයට සහභාගි කැරිණ. පාරිසරික ප්‍රශ්න විදහා දැක්වෙන ප්‍රදර්ශන භාණ්ඩ, ප්‍රදර්ශන කුටිවලට පැමිණි අමුත්තන් අතර බෙහෙවින් ජනප්‍රිය වූ අතර, මේ තරඟයයට සහභාගි වූ සිසුහු ප්‍රදර්ශන භාණ්ඩ තැනීම හා ඒවා මහජනයාට විස්තර කරදීම ද මඟින් ඉගෙනීමට අදාළ මහඟු අත්දැකීමක් ලදහ.

ගම්උදාව සම්බන්ධයෙන් පළ කරනු ලැබූ පුවත්පත් අතිරේකයට මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලිපියක් සපයන ලදී.

## ජාතික රුක්රෝපණ දිනය.

පාරිසරික පුරෝගාමී බළකායේ සහභාගිත්වය සඳහා විධිවිධාන යෙදීම මඟින් මධ්‍යම පරිසර අධිකාරිය විහාර මහා දේවී උද්‍යානයේ පැවැත්වුණු උත්සවයට සහභාගි විය. මේ හා සම්බන්ධයෙන් පුවත්පත් අතිරේකයක් පළ කරනු ලැබූ අතර, 1992 සැප්තැම්බර් මස 18 වැනි දින පේරාදෙණියේ පැවැත්වුණු ජනාධිපති ජංගම ලේකම් කාර්යාලයේදී බෙදා හැරීම සඳහා සංක්ෂිප්ත ලේඛනයක් සම්පාදනය කරන ලදී.

ජාතික රුක්රෝපණ දින කටයුතුවලට සහභාගි වන ලෙස රාජ්‍ය නොවන සංවිධානවලට, පාසල් සමිතිවලට සහ පාරිසරික පුරෝගාමී බළකායට ද දන්වන ලදී. රෝපණය කරන ලද ගස්වලට ආරක්ෂාව සැලසීම සඳහා විශේෂ විධිවිධාන යොදන ලද බැව් ලැබී ඇති වාර්තාවලින් පෙනී යේ.

මෙකී මාසය තුළදී සිළුමිණ, තරුණී සහ මිහිර පුවත්පත් රුක්රෝපණය සිය තේමාව කොට ගෙන තිබුණි.

## ලෝක පරිසර දිනය.

කොළඹ මහජන පුස්තකාලයේදී ලෝක පරිසර දිනය නිමිත්තෙන් පාරිසරික ප්‍රකාශන ද ඇතුළත් පොත් ප්‍රදර්ශනයක් පවත්වන ලද අතර, මෙය අමුත්තන් අතර බොහෝ ජනප්‍රිය වූ බැව් පෙනිණ. මේ ප්‍රදර්ශනය කොළඹ පුරපති විසින් විවෘත කරනු ලැබී ය.

ලෝක පරිසර දිනය නිමිත්තෙන් පුවත්පත් අතිරේකයක් පළ කරනු ලැබිණ.

මාලිගාකන්ද මහාබෝධි සමිතියේ ශ්‍රවණාගාරයෙහි පාසල් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. ලෝක පරිසර දිනය නිමිත්තෙන් විශේෂාංග පැවැත්වීමට රාජ්‍ය නොවන සංවිධානවලට මධ්‍යම පරිසර අධිකාරිය සහාය ලබාදී ඇත. මේ අංගවලට රචනා, චිත්‍ර සහ කථික තරඟ අයත් විය.

ලෝක පරිසර දිනය නිමිති කොට ගෙන සිළුමිණ, තරුණී සහ මිහිර යන පුවත්පත් විසින් පිළිවෙලින් රචනා තරඟයක්, කෙටි කථා තරඟයක් සහ හරස්පද ප්‍රහේලිකා තරඟයක් ද පවත්වන ලදී.

## කළුතර ජනාධිපති ජංගම ලේකම් කාර්යාලයට සහභාගිවීම.

කළුතර පවත්වන ලද ජනාධිපති ජංගම ලේකම් කාර්යාලයට මධ්‍යම පරිසර අධිකාරිය සහභාගිවීමේ වැදගත් අංගයක් වූයේ කළුතර විද්‍යාලයේ පවත්වන ලද

ප්‍රදර්ශනයයි. මේ ප්‍රදර්ශනය සංවිධානය කරන ලද්දේ විද්‍යාලයේ සොබා දහම් සිසු හවුල විසිනි. කළුතර දිස්ත්‍රික්කයේ පරිසරය පිළිබඳ තත්ත්වය ප්‍රදර්ශන භාණ්ඩවලින් නිරූපණය විය. ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ ප්‍රදර්ශනය පිළිබඳ මහත් උනන්දුවක් දැක්වූහ. මෙබඳු ප්‍රදර්ශන ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන වෙනත් බොහෝ පාසල්වලට මෙය ආදර්ශයක් බැව් සනාථ විය.

## පාරිසරික ප්‍රවෘත්ති.

නව ආරකින් වඩාත් සිත් ඇදගන්නා ලෙසට පාරිසරික පුවත් ත්‍රෛමාසික ප්‍රකාශනයක් මඟින් ඉදිරිපත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් යොදන ලදි. වර්ෂයේ මුල් ප්‍රකාශන දෙක පළ කරන ලදි.

## පාරිසරික තේමාවන් මත පුවත්පත් මඟින් පවත්වන ලද තරඟ.

මධ්‍යම පරිසර අධිකාරියේ සහාය ඇතිව, සිළුමිණ, තරුණි සහ මිහිර යන පුවත්පත් විසින් පිළිවෙලින් කෙටිකථා තරඟයක්, රචනා තරඟයක් සහ හරස් පද ප්‍රහේළිකාවක් ආරම්භ කරන ලදි. ඉන් සෑහෙන බලපෑමක් ඇති කරන ලද බැව් තරඟවලට ඇතුළත්වීම සඳහා ලැබී තිබුණු අයදුම්පත් විශාල සංඛ්‍යාවෙන් පෙනී යේ.

## ලෝක ජනාවාස දිනය.

1992 ඔක්තෝබර් 5 වැනි දිනට යෙදුණු ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් කොළඹ, සංඝරාජ මධ්‍ය මහා විද්‍යාලයේදී "භාණ්ඩ ප්‍රතිභාවිතය" යන තේමාව යටතේ විශේෂ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට මධ්‍යම පරිසර අධිකාරිය සැලසුම් කොට ඇත.

අසල පාසල් 25ක් ම සම්මන්ත්‍රණයට සහභාගී වනු ඇති අතර, සම්මන්ත්‍රණයට අනතුරුව ශිෂ්‍යයන් සහ පාසල් විසින් දියත් කරන ලද ප්‍රතිභාවිතය පිළිබඳ වැඩ සටහනේ සාර්ථකභාවය අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කරනු ලැබ ඇත.

## විවිධ.

ප්‍රාදේශීය බල මණ්ඩලවලට පාරිසරික කාර්යයන් විමධ්‍යගත කිරීම පිළිබඳව 1992 සැප්තැම්බර් 04 වැනි දින පැවති සම්මන්ත්‍රණය සංවිධානය කිරීමෙහිලා ප්‍රවර්ධන අංශය පරිසර හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට සහාය විය. තවද, "එන්වයරන් ලංකා" ප්‍රදර්ශනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වන ලද රැස්වීම්වලට ද මේ අංශය සහභාගි විය.

## පුස්තකාලය.

පහත සඳහන් තොරතුරු ප්‍රකාශන පුස්තකාලය විසින් පළ කරන ලදි.

1. පරිසරය පිළිබඳ ප්‍රවර්තන අන්තර්ගතයන්.(ප්‍රකාශන 07)

11. ප්‍රවර්තන අත්තර ගැනීම්(ප්‍රකාශන 01)

1991 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය ඇතුළත ශ්‍රීලාංකික පුවත්පත්වල පළවු ලිපි පිළිබඳ පාරිසරික සුචියක් සකසන ලදි. ළඟදීම මෙකී සුචිය ප්‍රකාශයට පත් කිරීමට අදහස් කෙරේ.

පොත්පත් පිළිබඳ දත්ත පදනමක් පුස්තකාලයේ පිහිටුවීම සඳහා සූක්ෂම පරිගණකයක් සහ මුද්‍රණ උපකරණයක් මිලදී ගැනීම සඳහා පියවර ගනු ලැබ ඇත.

පාරිසරික අධ්‍යාපනය පිළිබඳ වැඩ මුළුව උදෙසා විශේෂඥ ගුරුවරුන්ට සහාය වීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයෙහිදී එක් දින පාරිසරික පොත් ප්‍රදර්ශනයක් 1992 අගෝස්තු මස 6 වැනි දින පවත්වන ලදි.

ශ්‍රී ලංකා "ඉන්ෆොටෙරා" කේන්ද්‍ර ස්ථානයේ වැඩ කටයුතු 1992 ජුලි මාසයේදී පුස්තකාලයට පවරා ගන්නා ලදි.

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළදී පුස්තකාලය සෞඛ්‍ය විද්‍යා පුස්තකාල ජාලයේ සමාජිකත්වය ලැබිය.

1992 ජනවාරි 13 සිට පෙබරවාරි 26 දක්වා ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්ව විද්‍යාලයේදී "ස්ටෑන්ඩ් අලෝන් නෙට්වර්ක් සිස්ටම්ස්" ( Stand Alone Network System ) සඳහා වූ පරිගණක පාදක නාමාවලිකරණය ( Computer Based Cataloguing ) පිළිබඳ පුහුණු පාඨමාලාවකට පුස්තකාලයාධිපති සහභාගි විය.

මේ වර්ෂයේ නව දිල්ලියේ පැවැත්වීමට නියමිත "ඉන්ෆොටෙරා" ( INFOTERRA ) කළමනාකරණ රැස්වීමට සහභාගිවීම සඳහා පුස්තකාලයාධිපති -ගේ නම යෝජනා කරනු ලැබ ඇත.

ජාතික පාරිසරික තොරතුරු ක්‍රමයක් පිහිටුවීම සඳහා ක්‍රියා කරනු ලැබ ඇති අතර, අනුමතිය සඳහා "නොරාඩ්" ආයතනයට ඉදිරිපත් කරනු පිණිස ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කරනු ලැබ ඇත.

කාලසීමාව තුළදී කරනු ලැබූ මුළු ඉල්ලීම් ගණන 242 කි.